# ඇගයීම් වාර්තාව

## අ.පො.ස (සා.පෙළ) විභාගය - 2010

# 33 - ඉතිහාසය

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2010

# ඇගයීම් වාර්තාව

# 33 - ඉතිහාසය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**ඉතිහාසය**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2010

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහාය. ජාතික මට්ටමින් පවත්වන මෙම විභාගයේ ප්‍රතිඵල මත ලබාගන්නා සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික මෙන් ම ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස ප්‍රයෝජනවත් මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරුභවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එකසේ ප්‍රයෝජනවත්වනු නොඅනුමාන ය. මේ නිසා මෙය වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙහි I කොටසෙහි ඇතුළත් වේ. II වන කොටසෙහි පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනාවලින් සමන්විත වේ.

III වන කොටසෙහි, පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු හා ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව ඔබට මෙයින් යම් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මකබව වැඩි දියුණුව සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස, ඉල්ලා සිටිමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ ප්‍රධාන පරීක්ෂකවරුන්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ එම කාර්ය මණ්ඩලයටත්, මෙය මැනවින් මුද්‍රණය කර දුන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලාධිපතිතුමා ඇතුලු එම කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයාංගම ස්තූතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2012 ජනවාරි 20
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරෙන් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පවත්වන මෙම විභාගයේ ප්‍රතිඵල මත ලබාගන්නා සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික මෙන්ම ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස ප්‍රයෝජනවත් මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකර ගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එකසේ ප්‍රයෝජනවත්වනු නොඅනුමාන ය. මේ නිසා මෙය වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත ය.

I කොටසේ විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ තොරතුරු දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප අනුවත් ප්‍රශ්න පත්‍ර වශයෙන් වෙන් වෙන්වත් ඇතුළත් වේ.

II වන කොටස පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා මග පෙන්වීම්වලින් සමන්විත වේ.

III වන කොටසෙහි, පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු හා ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ ව ඔබට මෙයින් යම් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මකබව වැඩි දියුණුව සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස, ඉල්ලා සිටිමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ ප්‍රධාන ඇගයීම් පරීක්ෂකවරුන්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ එම කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මේ සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ ලෝක බැංකු අධ්‍යාපන ආංශික ප්‍රදානයේ (ESDG) කාර්ය මණ්ඩලයටත් මගේ ස්තුතිය පළ කරන්නේ බැතියෙනි.

අනුර එදිරිසිංහ
විභාග කොමසාරිස් ජනරාල්

2010 සැප්තැම්බර් 20
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර මයා<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර මිය<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය හා සංස්කරණය** | : | එස්.එන්. ප්‍රේමතිලක මයා<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| | | එම්. ජීවරාණි පුනිදා මිය<br>සහකාර විභාග කොමසාරිස් |
| **සැකසුම් කමිටුව** | : | එස්.ඩී.එස්. වීරක්කොඩි මිය<br>ගුරු සේවය I<br>වේල්ස් කුමර විදුහල<br>මොරටුව |
| | | ඩබ්.ඒ. ප්‍රේමලතා මිය<br>ගුරු සේවය I<br>ර/ ඇහැලියගොඩ ධර්මපාල මහා විද්‍යාලය<br>ඇහැලියගොඩ |
| | | නිර්මලා මුත්තෙයා මිය<br>ගුරු සේවය I<br>කො/ හින්දු විද්‍යාලය<br>නො. 77, ලෝරන්ස් පාර<br>කොළඹ 04 |
| **පරිගණක පිටපත සැකසුම** | : | ඩබ්.ඒ.ඩී. චතුරිකා දිසානායක මෙනවිය<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු

පිටු අංකය


**I කොටස**

1. **විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

   1.1 **විෂය අභිමතාර්ථ** 1

   1.2 **විෂය සාධනය පිළිබඳ තොරතුරු**

   1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
   1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
   1.2.3. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
   1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
   1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

   1.3 **විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය**

   1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
   1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
   1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
   1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10

**II කොටස**

2. **ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

   2.1 **I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

   2.1.1. I ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 13
   2.1.2. I ප්‍රශ්න පත්‍රය 14
   2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
   2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 19

   2.2 **II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

   2.2.1. II ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 21
   2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන 22

**III කොටස**

3. **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා**

   3.1 **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු** 45

   3.2 **ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා** 46

## I කොටස

### 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

#### 1.1. විෂය අභිමතාර්ථ

- ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ විමර්ශනයෙහි යෙදෙයි.
- වර්තමානය තේරුම් ගැනීම සඳහා අතීතය පිළිබඳ විමර්ශනාත්මක දැනුම උපයෝගී කර ගනියි.
- ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව විමසා බලමින් කටයුතු කරයි.
- වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන ආදර්ශයට ගෙන කටයුතු කරයි.
- ජාතික අනන්‍යතාව හඳුනාගෙන ඒවා අගය කරමින් චරිතායනය කරයි.
- ඉතිහාසයේ අත්දැකීම් වර්තමාන සංසිද්ධින් සඳහා ඵලදායි ලෙස භාවිත කරයි.
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම් හා හර පද්ධතින් පිළිබඳ අභිමානවත් හැඟුමින් කටයුතු කරයි.
- විචාරශීලී හා විවේචනාත්මක චින්තන සංකල්ප වර්ධනය කර ගනියි.
- ඓතිහාසික තොරතුරු ඇසුරින් ස්ථාන හඳුනා ගැනීමේ හැකියාව දියුණු කරයි.

## 1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 240,155 | 6,335 | 246,490 |
| දෙමළ | 65,480 | 10,455 | 75,935 |
| ඉංග්‍රීසි | 7,555 | 2,175 | 9,730 |
| එකතුව | **313,190** | **18,965** | **332,155** |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 25,737 | 8.22 | 178 | 0.94 | 25,915 | 7.80 |
| B | 24,159 | 7.71 | 320 | 1.69 | 24,479 | 7.37 |
| C | 79,359 | 25.34 | 2,826 | 14.90 | 82,185 | 24.74 |
| S | 101,508 | 32.41 | 8,257 | 43.54 | 109,765 | 33.05 |
| W | 82,427 | 26.32 | 7,384 | 38.93 | 89,811 | 27.04 |
| එකතුව | **313,190** | **100.00** | **18,965** | **100.00** | **332,155** | **100.00** |

වගුව 2

### 1.2.3. පළමු වතාවට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 13625 | 3341 | 24.52 | 1795 | 13.17 | 3435 | 25.21 | 2790 | 20.48 | 11361 | 83.38 | 2264 | 16.62 |
| 2. හෝමාගම | 3388 | 350 | 10.33 | 345 | 10.18 | 904 | 26.68 | 922 | 27.21 | 2521 | 74.41 | 867 | 25.59 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 6486 | 1053 | 16.23 | 798 | 12.30 | 1951 | 30.08 | 1662 | 25.62 | 5464 | 84.24 | 1022 | 15.76 |
| 4. පිළියන්දල | 5589 | 799 | 14.30 | 668 | 11.95 | 1692 | 30.27 | 1524 | 27.27 | 4683 | 83.79 | 906 | 16.21 |
| 5. ගම්පහ | 7004 | 1303 | 18.60 | 844 | 12.05 | 1917 | 27.37 | 1723 | 24.60 | 5787 | 82.62 | 1217 | 17.38 |
| 6 මිනුවන්ගොඩ | 4590 | 363 | 7.91 | 435 | 9.48 | 1262 | 27.49 | 1363 | 29.69 | 3423 | 74.58 | 1167 | 25.42 |
| 7. මීගමුව | 6737 | 649 | 9.63 | 535 | 7.94 | 1661 | 24.65 | 2008 | 29.81 | 4853 | 72.04 | 1884 | 27.96 |
| 8. කැලණිය | 6406 | 623 | 9.73 | 647 | 10.10 | 1832 | 28.60 | 1893 | 29.55 | 4995 | 77.97 | 1411 | 22.03 |
| 9. කළුතර | 7050 | 921 | 13.06 | 770 | 10.92 | 1926 | 27.32 | 1984 | 28.14 | 5601 | 79.45 | 1449 | 20.55 |
| 10. මතුගම | 2823 | 447 | 15.83 | 321 | 11.37 | 720 | 25.50 | 714 | 25.29 | 2202 | 78.00 | 621 | 22.00 |
| 11. හොරණ | 4051 | 567 | 14.00 | 495 | 12.22 | 1141 | 28.17 | 1068 | 26.36 | 3271 | 80.75 | 780 | 19.25 |
| 12. මහනුවර | 6891 | 1282 | 18.60 | 899 | 13.05 | 1945 | 28.23 | 1616 | 23.45 | 5742 | 83.33 | 1149 | 16.67 |
| 13. දෙනුවර | 2141 | 55 | 2.57 | 102 | 4.76 | 501 | 23.40 | 751 | 35.08 | 1409 | 65.81 | 732 | 34.19 |
| 14. ගම්පොල | 3270 | 113 | 3.46 | 204 | 6.24 | 740 | 22.63 | 1124 | 34.37 | 2181 | 66.70 | 1089 | 33.30 |
| 15. තෙල්දෙණිය | 1849 | 54 | 2.92 | 87 | 4.71 | 425 | 22.99 | 586 | 31.69 | 1152 | 62.30 | 697 | 37.70 |
| 16. වත්තේගම | 2433 | 114 | 4.69 | 190 | 7.81 | 624 | 25.65 | 786 | 32.31 | 1714 | 70.45 | 719 | 29.55 |
| 17. කටුගස්තොට | 3158 | 141 | 4.46 | 182 | 5.76 | 919 | 29.10 | 1047 | 33.15 | 2289 | 72.48 | 869 | 27.52 |
| 18. මාතලේ | 3323 | 355 | 10.68 | 279 | 8.40 | 855 | 25.73 | 988 | 29.73 | 2477 | 74.54 | 846 | 25.46 |
| 19. ගලේවෙල | 2168 | 88 | 4.06 | 139 | 6.41 | 553 | 25.51 | 653 | 30.12 | 1433 | 66.10 | 735 | 33.90 |
| 20. නාඋල | 578 | 36 | 6.23 | 51 | 8.82 | 169 | 29.24 | 158 | 27.34 | 414 | 71.63 | 164 | 28.37 |
| 21. විල්ගමුව | 579 | 6 | 1.04 | 29 | 5.01 | 99 | 17.10 | 191 | 32.99 | 325 | 56.13 | 254 | 43.87 |
| 22. නුවරඑළිය | 2495 | 50 | 2.00 | 97 | 3.89 | 497 | 19.92 | 949 | 38.04 | 1593 | 63.85 | 902 | 36.15 |
| 23. කොත්මලේ | 1314 | 56 | 4.26 | 85 | 6.47 | 301 | 22.91 | 453 | 34.47 | 895 | 68.11 | 419 | 31.89 |
| 24. හැටන් | 2829 | 96 | 3.39 | 162 | 5.73 | 735 | 25.98 | 1001 | 35.38 | 1994 | 70.48 | 835 | 29.52 |
| 25. වලපනේ | 1414 | 45 | 3.18 | 71 | 5.02 | 289 | 20.44 | 435 | 30.76 | 840 | 59.41 | 574 | 40.59 |
| 26. හඟුරන්කෙත | 1579 | 97 | 6.14 | 112 | 7.09 | 372 | 23.56 | 521 | 33.00 | 1102 | 69.79 | 477 | 30.21 |
| 27. ගාල්ල | 6715 | 1221 | 18.18 | 769 | 11.45 | 1758 | 26.18 | 1636 | 24.36 | 5384 | 80.18 | 1331 | 19.82 |
| 28. ඇල්පිටිය | 3208 | 166 | 5.17 | 240 | 7.48 | 815 | 25.41 | 1031 | 32.14 | 2252 | 70.20 | 956 | 29.80 |
| 29. අම්බලන්ගොඩ | 3544 | 368 | 10.38 | 333 | 9.40 | 895 | 25.25 | 966 | 27.26 | 2562 | 72.29 | 982 | 27.71 |
| 30. උඩුගම | 1958 | 103 | 5.26 | 144 | 7.35 | 471 | 24.06 | 611 | 31.21 | 1329 | 67.88 | 629 | 32.12 |
| 31. මාතර | 5069 | 956 | 18.86 | 662 | 13.06 | 1421 | 28.03 | 1138 | 22.45 | 4177 | 82.40 | 892 | 17.60 |
| 32. අකුරැස්ස | 2005 | 234 | 11.67 | 239 | 11.92 | 601 | 29.98 | 519 | 25.89 | 1593 | 79.45 | 412 | 20.55 |
| 33. මුලටියන-හක්මණ | 2222 | 166 | 7.47 | 212 | 9.54 | 633 | 28.49 | 686 | 30.87 | 1697 | 76.37 | 525 | 23.63 |
| 34. මොරවක-දෙනියාය | 2438 | 109 | 4.47 | 159 | 6.52 | 564 | 23.13 | 745 | 30.56 | 1577 | 64.68 | 861 | 35.32 |
| 35. තංගල්ල | 2706 | 249 | 9.20 | 255 | 9.42 | 770 | 28.46 | 798 | 29.49 | 2072 | 76.57 | 634 | 23.43 |

වගුව 3

## 1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 36. හම්බන්තොට | 3902 | 241 | 6.18 | 302 | 7.74 | 1014 | 25.99 | 1170 | 29.98 | 2727 | 69.89 | 1175 | 30.11 |
| 37. වලස්මුල්ල | 2625 | 396 | 15.09 | 312 | 11.89 | 687 | 26.17 | 691 | 26.32 | 2086 | 79.47 | 539 | 20.53 |
| 38. යාපනය | 3158 | 264 | 8.36 | 280 | 8.87 | 842 | 26.66 | 888 | 28.12 | 2274 | 72.01 | 884 | 27.99 |
| 39. දූපත | 606 | 6 | 0.99 | 14 | 2.31 | 75 | 12.38 | 193 | 31.85 | 288 | 47.52 | 318 | 52.48 |
| 40. තෙන්මාරච්චි | 983 | 46 | 4.68 | 78 | 7.93 | 248 | 25.23 | 318 | 32.35 | 690 | 70.19 | 293 | 29.81 |
| 41. වලිකාමන් | 2398 | 84 | 3.50 | 161 | 6.71 | 550 | 22.94 | 746 | 31.11 | 1541 | 64.26 | 857 | 35.74 |
| 42. වඩමරච්චි | 1531 | 94 | 6.14 | 103 | 6.73 | 353 | 23.06 | 421 | 27.50 | 971 | 63.42 | 560 | 36.58 |
| 43. කිලිනොච්චි | 2071 | 18 | 0.87 | 53 | 2.56 | 303 | 14.63 | 594 | 28.68 | 968 | 46.74 | 1103 | 53.26 |
| 44. මන්නාරම | 1109 | 24 | 2.16 | 69 | 6.22 | 324 | 29.22 | 428 | 38.59 | 845 | 76.19 | 264 | 23.81 |
| 45. මඩු | 292 | 0 | 0.00 | 3 | 1.03 | 17 | 5.82 | 71 | 24.32 | 91 | 31.16 | 201 | 68.84 |
| 46. වව්නියාව | 2124 | 95 | 4.47 | 141 | 6.64 | 630 | 29.66 | 802 | 37.76 | 1668 | 78.53 | 456 | 21.47 |
| 47. වව්නියාව උතුර | 586 | 3 | 0.51 | 9 | 1.54 | 101 | 17.24 | 219 | 37.37 | 332 | 56.66 | 254 | 43.34 |
| 48. මුලතිව් | 966 | 7 | 0.72 | 27 | 2.80 | 136 | 14.08 | 285 | 29.50 | 455 | 47.10 | 511 | 52.90 |
| 49. තුනුක්කායි | 602 | 5 | 0.83 | 16 | 2.66 | 60 | 9.97 | 193 | 32.06 | 274 | 45.51 | 328 | 54.49 |
| 50. මඩකලපුව | 2271 | 145 | 6.38 | 143 | 6.30 | 560 | 24.66 | 785 | 34.57 | 1633 | 71.91 | 638 | 28.09 |
| 51. කල්කුඩා | 1096 | 15 | 1.37 | 19 | 1.73 | 164 | 14.96 | 397 | 36.22 | 595 | 54.29 | 501 | 45.71 |
| 52. පදිරිප්පු | 1598 | 65 | 4.07 | 80 | 5.01 | 376 | 23.53 | 544 | 34.04 | 1065 | 66.65 | 533 | 33.35 |
| 53. මඩකලපුව (මධ්‍යම) | 1306 | 141 | 10.80 | 126 | 9.65 | 440 | 33.69 | 420 | 32.16 | 1127 | 86.29 | 179 | 13.71 |
| 54. අම්පාර | 2493 | 129 | 5.17 | 214 | 8.58 | 767 | 30.77 | 823 | 33.01 | 1933 | 77.54 | 560 | 22.46 |
| 55. කල්මුනේ | 2029 | 158 | 7.79 | 164 | 8.08 | 689 | 33.96 | 683 | 33.66 | 1694 | 83.49 | 335 | 16.51 |
| 56. සමන්තුරෙයි | 1086 | 56 | 5.16 | 77 | 7.09 | 304 | 27.99 | 418 | 38.49 | 855 | 78.73 | 231 | 21.27 |
| 57. මහඔය | 502 | 8 | 1.59 | 32 | 6.37 | 125 | 24.90 | 182 | 36.25 | 347 | 69.12 | 155 | 30.88 |
| 58. දෙහිඅත්තකන්ඩිය | 1100 | 28 | 2.55 | 68 | 6.18 | 307 | 27.91 | 325 | 29.55 | 728 | 66.18 | 372 | 33.82 |
| 59. අක්කරෙයිපත්තුව | 1830 | 69 | 3.77 | 74 | 4.04 | 548 | 29.95 | 806 | 44.04 | 1497 | 81.80 | 333 | 18.20 |
| 60. ත්‍රිකුණාමලය | 1931 | 147 | 7.61 | 176 | 9.11 | 544 | 28.17 | 601 | 31.12 | 1468 | 76.02 | 463 | 23.98 |
| 61. මුතූර් | 1015 | 46 | 4.53 | 51 | 5.02 | 218 | 21.48 | 399 | 39.31 | 714 | 70.34 | 301 | 29.66 |
| 62. කන්තලේ | 1180 | 15 | 1.27 | 52 | 4.41 | 286 | 24.24 | 418 | 35.42 | 771 | 65.34 | 409 | 34.66 |
| 63. කින්නියා | 1324 | 35 | 2.64 | 58 | 4.38 | 276 | 20.85 | 536 | 40.48 | 905 | 68.35 | 419 | 31.65 |
| 64. කුරුණෑගල | 5019 | 724 | 14.43 | 562 | 11.20 | 1545 | 30.78 | 1330 | 26.50 | 4161 | 82.90 | 858 | 17.10 |
| 65. කුලියාපිටිය | 3717 | 369 | 9.93 | 337 | 9.07 | 1008 | 27.12 | 1167 | 31.40 | 2881 | 77.51 | 836 | 22.49 |
| 66. නිකවැරටිය | 2927 | 175 | 5.98 | 223 | 7.62 | 863 | 29.48 | 959 | 32.76 | 2220 | 75.85 | 707 | 24.15 |
| 67. මහව | 3590 | 152 | 4.23 | 233 | 6.49 | 971 | 27.05 | 1178 | 32.81 | 2534 | 70.58 | 1056 | 29.42 |
| 68. ගිරිඋල්ල | 3765 | 332 | 8.82 | 328 | 8.71 | 1130 | 30.01 | 1089 | 28.92 | 2879 | 76.47 | 886 | 23.53 |
| 69. ඉබ්බාගමුව | 2727 | 219 | 8.03 | 275 | 10.08 | 761 | 27.91 | 811 | 29.74 | 2066 | 75.76 | 661 | 24.24 |
| 70. පුත්තලම | 4428 | 212 | 4.79 | 264 | 5.96 | 1146 | 25.88 | 1552 | 35.05 | 3174 | 71.68 | 1254 | 28.32 |
| 71. හලාවත | 5041 | 422 | 8.37 | 446 | 8.85 | 1209 | 23.98 | 1557 | 30.89 | 3634 | 72.09 | 1407 | 27.91 |
| 72. අනුරාධපුරය | 4083 | 416 | 10.19 | 341 | 8.35 | 1121 | 27.46 | 1196 | 29.29 | 3074 | 75.29 | 1009 | 24.71 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 73. තඹුත්තේගම | 2237 | 87 | 3.89 | 145 | 6.48 | 534 | 23.87 | 686 | 30.67 | 1452 | 64.91 | 785 | 35.09 |
| 74. කැකිරාව | 2333 | 90 | 3.86 | 127 | 5.44 | 609 | 26.10 | 709 | 30.39 | 1535 | 65.80 | 798 | 34.20 |
| 75. ගලෙන්බිඳුනුවැව | 1454 | 43 | 2.96 | 84 | 5.78 | 357 | 24.55 | 520 | 35.76 | 1004 | 69.05 | 450 | 30.95 |
| 76. කැබිතිගොල්ලෑව | 1789 | 48 | 2.68 | 87 | 4.86 | 375 | 20.96 | 594 | 33.20 | 1104 | 61.71 | 685 | 38.29 |
| 77. පොළොන්නරුව | 1655 | 149 | 9.00 | 149 | 9.00 | 416 | 25.14 | 487 | 29.43 | 1201 | 72.57 | 454 | 27.43 |
| 78. හිඟුරක්ගොඩ | 2221 | 140 | 6.30 | 146 | 6.57 | 530 | 23.86 | 659 | 29.67 | 1475 | 66.41 | 746 | 33.59 |
| 79. දිඹුලාගල | 1544 | 38 | 2.46 | 60 | 3.89 | 344 | 22.28 | 565 | 36.59 | 1007 | 65.22 | 537 | 34.78 |
| 80. බදුල්ල | 3399 | 234 | 6.88 | 296 | 8.71 | 846 | 24.89 | 1068 | 31.42 | 2444 | 71.90 | 955 | 28.10 |
| 81. බණ්ඩාරවෙල | 2989 | 292 | 9.77 | 277 | 9.27 | 857 | 28.67 | 876 | 29.31 | 2302 | 77.02 | 687 | 22.98 |
| 82. මහියංගනය | 2061 | 89 | 4.32 | 107 | 5.19 | 458 | 22.22 | 649 | 31.49 | 1303 | 63.22 | 758 | 36.78 |
| 83. වැලිමඩ | 2616 | 78 | 2.98 | 152 | 5.81 | 710 | 27.14 | 896 | 34.25 | 1836 | 70.18 | 780 | 29.82 |
| 84. පස්සර | 1140 | 32 | 2.81 | 59 | 5.18 | 243 | 21.32 | 387 | 33.95 | 721 | 63.25 | 419 | 36.75 |
| 85. මොණරාගල | 2236 | 88 | 3.94 | 118 | 5.28 | 462 | 20.66 | 666 | 29.79 | 1334 | 59.66 | 902 | 40.34 |
| 86. වැල්ලවාය | 3139 | 131 | 4.17 | 181 | 5.77 | 680 | 21.66 | 951 | 30.30 | 1943 | 61.90 | 1196 | 38.10 |
| 87. බිබිල | 1752 | 52 | 2.97 | 100 | 5.71 | 386 | 22.03 | 524 | 29.91 | 1062 | 60.62 | 690 | 39.38 |
| 88. රත්නපුර | 5750 | 629 | 10.94 | 540 | 9.39 | 1544 | 26.85 | 1527 | 26.56 | 4240 | 73.74 | 1510 | 26.26 |
| 89. බළන්ගොඩ | 2764 | 163 | 5.90 | 231 | 8.36 | 724 | 26.19 | 828 | 29.96 | 1946 | 70.41 | 818 | 29.59 |
| 90. නිවිතිගල | 2524 | 89 | 3.53 | 161 | 6.38 | 585 | 23.18 | 805 | 31.89 | 1640 | 64.98 | 884 | 35.02 |
| 91. ඇඹිලිපිටිය | 3639 | 238 | 6.54 | 271 | 7.45 | 916 | 25.17 | 1044 | 28.69 | 2469 | 67.85 | 1170 | 32.15 |
| 92. කෑගල්ල | 4289 | 561 | 13.08 | 449 | 10.47 | 1204 | 28.07 | 1147 | 26.74 | 3361 | 78.36 | 928 | 21.64 |
| 93. මාවනැල්ල | 3551 | 243 | 6.84 | 324 | 9.12 | 1065 | 29.99 | 1024 | 28.84 | 2656 | 74.80 | 895 | 25.20 |
| 94. දෙහිඕවිට | 3189 | 180 | 5.64 | 246 | 7.71 | 894 | 28.03 | 1000 | 31.36 | 2320 | 72.75 | 869 | 27.25 |
| **සමස්ත දිවයින** | **270917** | **25631** | **9.46** | **23576** | **8.70** | **70830** | **26.14** | **79847** | **29.47** | **199884** | **73.78** | **71033** | **26.22** |

වගුව 4

1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 1023 | 0.31 | 332155 | 100.00 |
| 81 - 90 | 7378 | 2.22 | 331132 | 99.69 |
| 71 - 80 | 15579 | 4.69 | 323754 | 97.47 |
| 61 - 70 | 23356 | 7.03 | 308175 | 92.78 |
| 51 - 60 | 37879 | 11.40 | 284819 | 85.75 |
| 41 - 50 | 54110 | 16.30 | 246940 | 74.34 |
| 31 - 40 | 77930 | 23.50 | 192830 | 58.05 |
| 21 - 30 | 77967 | 23.50 | 114900 | 34.59 |
| 11 - 20 | 34878 | 10.50 | 36933 | 11.12 |
| 01 - 10 | 2021 | 0.61 | 2055 | 0.62 |
| 00 - 00 | 34 | 0.01 | 34 | 0.01 |

වගුව 5

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා:- (31 - 40 අතර පරාසය ගතහොත්)
මෙම විෂයය සඳහා ලකුණු 31 - 40 අතර ලකුණු ලබාගත් සංඛ්‍යාව 77930කි. එය ප්‍රතිශතයක් වශයෙන් 23.5%කි. ලකුණු 40ට හා ඊට අඩුවෙන් ලකුණු ලබා ඇති සංඛ්‍යාව 192830ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 58.05%කි.

## 1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය





ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- ඉහත ප්‍රස්තාරයට අනුව, 1 වන ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 65%ක් වන අතර, 5 වන ප්‍රශ්නයට නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 15%ක් පමණ වේ. ඒ අනුව පහසුතාව අඩු ම ප්‍රශ්නය වශයෙන් 5 වන ප්‍රශ්නය දැක්විය හැකි ය.

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- ප්‍රශ්න තෝරා ගැනීමේ දී පිළිතුරු සැපයීම සඳහා 2වන ප්‍රශ්නය 92%ක් පමණ තෝරාගෙන ඇති අතර 83%ක් පමණ 3වන ප්‍රශ්නය තෝරාගෙන ඇත.

ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි 1වන ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 30 කි. ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 76 - 100% පරාසයේ ලකුණු ප්‍රමාණයක් එනම් ලකුණු 23-30 අතර ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ඇත්තේ 1 වන ප්‍රශ්නය සඳහා පිළිතුරු ලියූවන්ගෙන් 5%ක ප්‍රතිශතයක් පමණි. මේ ආකාරයට එම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු වලින් 51-75% පරාසයේ (ලකුණු 16-22) ප්‍රමාණයක් එම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලියූවන්ගෙන් 21%ක් ද ලකුණුවලින් 51-75%ක් ප්‍රමාණයක් (ලකුණු 8-15) පිළිතුරු ලියූවන්ගෙන් 51% ක්ද, ලකුණු 0-25% ක් (ලකුණු 0-7) පිළිතුරු ලියූවන්ගෙන් 23%ක් ද හිමි කරගෙන ඇත.

ප්‍රස්තාරය 3 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)


1.3.4. **II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය**




ප්‍රස්තාරය 4.1 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)


ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 1වන ප්‍රශ්නයේ එක් එක් කොටස සඳහා සාර්ථකව පිළිතුරු සැපයූ ප්‍රතිශතය අ (i) කොටස සඳහා 26%ක් පමණ පිරිසක් ද, අ (ii) කොටස සඳහා 16%ක් පමණ පිරිසක් ද, පිළිතුරු සපයා ඇත.



අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2010
33 - ඉතිහාසය - II පත්‍රය
ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා ඇති ආකාරය
ප්‍රතිශතය
100
90
80
70
60
50
40
30
20
10
0
A B C A B C D A B C D A B C A B C D A B C A B A B C
i ii iii iv i ii iii iv i ii iii iv i ii iii iv i ii iii iv
2 3 4 5 6
ප්‍රශ්න අංක - කොටස් හා අනු කොටස් අනුව


ප්‍රස්තාරය 4.2


අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2010
33 - ඉතිහාසය - II පත්‍රය
ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා ඇති ආකාරය
ප්‍රතිශතය
0
10
20
30
40
50
60
70
80
90
100
A B C A B A B C A B A B C D A B C A B
i ii iii iv i ii iii iv i ii iii iv i ii iii iv
7 8 9 10
ප්‍රශ්න අංක - කොටස් හා අනු කොටස් අනුව

ප්‍රස්තාරය 4.3

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 01කි. මුළු ලකුණු 80කි.

- ⋆ මෙම බහුවරණ ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.
- ⋆ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.
- ⋆ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3) හා (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තේරීමට අපේක්ෂකයාට සිදුවේ.

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

1. "ඉතිහාසය එක් විෂයයක් නොව විෂයයන් සියල්ල අන්තර්ගත ගෘහය" ලෙස ප්‍රකාශ කර ඇති ඉතිහාසඥයා වන්නේ,
   (1) ජී.එම්. ට්‍රෙව්ලියන් ය. (2) ඊ.එච්. කාර් ය.
   (3) එච්.ජී. වෙල්ස් ය. (4) ටී.එස්. එලියට් ය.

2. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු හෙළි කර ගත හැකි මූලාශ්‍රය මින් කවරක් ද?
   (1) සෙල් ලිපි (2) මහාවංසය (3) ගල් මෙවලම් (4) ගොඩනැගිලිවල නටබුන්

3. 15 වැනි සියවසේ ආරම්භයේ දී පමණ යාපනය ප්‍රදේශය විජයනගර අධිරාජ්‍යයට යටත්ව පැවැති බවට තොරතුරු සඳහන් වන මූලාශ්‍රය මින් කවරක් ද?
   (1) පනාකඩුව තඹ සන්නස (2) ආලම්පුණ්ඩි තඹ සන්නස
   (3) වල්ලිපුරම් රන් සන්නස (4) සෙගරාජ සේගරමාලෙයි ග්‍රන්ථය

4. පළමුවැනි පරාක්‍රමබාහු හා දෙවැනි ගජබාහු අතර ඇතිකරගත් ඓතිහාසික සමගි සම්මුතිය දැක්වෙනුයේ,
   (1) සංගමුවිහාර ශිලා ලිපියේ ය. (2) ගල්පොත ශිලා ලිපියේ ය.
   (3) දෙවනගල ශිලා ලිපියේ ය. (4) හබැස්ස ශිලා ලිපියේ ය.

5. ගෝණ නදියේ මුවදෙර පිහිටා තිබූ පැරණි වරාය වන්නේ,
   (1) උරුවේල ය. (2) මහාතිත්ථ ය. (3) ගොඩවාය ය. (4) ගෝකණ්ණ ය.

6. කදම්බ නදී, ගෝණ නදී, වන නදී යන ගංගාවල නූතන නාම දැක්වෙන්නේ කිනම් පිළිතුරේ ද?
   (1) මල්වතු ඔය, කලා ඔය, වලවේ ගඟ (2) මල්වතු ඔය, දැදුරු ඔය, ගල් ඔය
   (3) කලා ඔය, වලවේ ගඟ, කණදරා ඔය (4) කණදරා ඔය, කලා ඔය, මල්වතු ඔය

7. අනුරාධපුරය අංග සම්පූර්ණ අගනගරයක් බවට පත් කරන ලද්දේ කිනම් රජතුමා විසින් ද?
   (1) විජය (2) දේවානම්පිය තිස්ස (3) පණ්ඩුකාභය (4) දුටුගැමුණු

8. ඍග් වෛදික ආර්යයන්ගේ ආගමික ඇදහිලි හා විශ්වාසවල කැපී පෙනෙන ලක්ෂණය වූයේ,
   (1) ස්වාභාවික වස්තූන් දේවත්වයෙහි ලා ඇදහීමයි.
   (2) බ්‍රහ්ම-විෂ්ණු හා ඊශ්වර යන හින්දු ත්‍රිමූර්තිය කෙරෙහි වූ විශ්වාසයයි.
   (3) මාතෘ දෙවඟනට වැඳුම් පිදුම් කිරීමයි.
   (4) භාවනා ක්‍රම හා තපස්දම් රැකීම මුල්තැනෙහි ලා සැලකීමයි.

9. ක්‍රි.පූ. 6 සියවසේ උතුරු ඉන්දියාවේ ඇති වූ සොළොස්මහා ජනපද අතුරෙන් සමූහාණ්ඩු හෙවත් 'ගණ' රාජ්‍ය ලෙස සැලකුණ රාජ්‍ය දෙකකි.
   (1) මගධ හා කෝසල (2) අවන්ති හා වත්ස (3) වජ්ජි හා මල්ල (4) කුරු හා පංචාල

10. පහත දැක්වෙන රජවරුන් මගධ රාජ්‍යයේ බලයට පත් වූ අනුපිළිවෙළ අනුව පෙළ ගැස් වූ විට නිවැරදි පිළිතුර කුමක් ද?
    *A* - අජාසත්ත
    *B* - මහා පද්ම නන්ද
    *C* - බිම්බිසාර
    *D* - චන්ද්‍රගුප්ත මෞර්ය
    *E* - අශෝක
    (1) *CABDE* (2) *BCAED* (3) *BADBE* (4) *CADBE*

11. *A* - මහා ඇලෙක්සැන්ඩර් රජුගේ ඉන්දියානු ආක්‍රමණය
    *B* - චාණක්‍ය බමුණා, රජුගේ අග්‍ර පුරෝහිත වශයෙන් කටයුතු කිරීම
    *C* - තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීම
    *D* - විදේශීය රටවලට ධර්මදූත කණ්ඩායම් යැවීම
    *E* - මහායාන බුද්ධ ධර්මය ව්‍යාප්ත වීම
    අශෝක අධිරාජයාගේ කාලයට අයත් වන ඓතිහාසික සිද්ධි ඇතුළත් පිළිතුර මින් කුමක් ද?
    (1) *A* හා *B* (2) *C* හා *D* (3) *D* හා *E* (4) *A* හා *E*

12. ලංකාවට පැමිණි විදේශ ආක්‍රමණිකයන් කිහිපදෙනකු I තීරුවේ ද, ඔවුන්ගෙන් රට බේරා ගත් රජවරුන් II තීරුවේ ද, දක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| (i) සේන, ගුත්තික | *A.* ධාතුසේන |
| (ii) පණ්ඩු, පාරින්ද ඇතුළු පිරිස | *B.* දෙවැනි පරාක්‍රමබාහු රජ |
| (iii) පළමුවැනි රාජේන්ද්‍ර | *C.* අසේල රජ |
| (iv) කාලිංග මාඝ | *D.* හතරවැනි මහින්ද රජ |
| | *E.* පළමුවැනි විජයබාහු රජ |

(1) *CAEB* (2) *ACBD* (3) *ACDE* (4) *CEAB*

13. *A* - අලහබාද් ප්‍රශස්තිය කරවීම
*B* - සිව්වැනි ධර්ම සංගායනාව පැවැත්වීම
*C* - ගංගානම් තැන්න යටත් කර ගැනීම
*D* - බුදු පිළිම තෙළීමේ ආරම්භය
කුෂාණ අධිරාජ්‍ය යුගයට අයත් ඓතිහාසික සිද්ධීන් දක්වෙනුයේ කිනම් පිළිතුරේ ද?
(1) *A* හා *B* (2) *B* හා *C* (3) *B* හා *D* (4) *A* හා *D*

14. ඉන්දීය ඉතිහාසයේ වැදගත් ඓතිහාසික සිදුවීම් කිහිපයක් I තීරුවේ ද, ඒ හා සම්බන්ධ රජවරුන් II තීරුවේ ද දක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| (i) විවාහ සබඳතා මගින් මගධයේ බලය ව්‍යාප්ත කිරීම | *A.* කණිෂ්ක රජ |
| (ii) මගධයේ අගනුවර පාටලීපුත්‍ර නගරයට මාරු කිරීම | *B.* බිම්බිසාර රජ |
| (iii) ධර්ම මහාමාත්‍රවරුන් පත් කිරීම | *C.* ධර්මාශෝක රජ |
| (iv) හතරවැනි ධර්ම සංගායනාවට අනුග්‍රහ දැක්වීම | *D.* අජාසත්ත රජ |
| | *E.* චන්ද්‍රගුප්ත රජ |

(1) *BCDA* (2) *BDCA* (3) *EBCD* (4) *DBCA*

15. මෞර්ය අධිරාජ්‍යයේ අශෝක රජතුමාගේ දේශපාලන ප්‍රතිපත්තියෙහි විශාල පෙරළියක් හටගැනීමට බලපෑ ප්‍රධානතම සිදුවීම මින් කවරක් ද?
(1) අශෝක රජතුමා බුදු දහම වැළඳගැනීම
(2) කාලිංග සටනින් සිදු වූ විශාල ජීවිත හානිය
(3) මොග්ගලීපුත්ත තිස්ස තෙරුන්ගේ මූලිකත්වයෙන් තුන්වැනි ධර්ම සංගායනාව පැවැත්වීම
(4) අශෝක ධර්මය ක්‍රියාත්මක කිරීම සඳහා ධර්ම මහාමාත්‍රයින් පත් කිරීම

16. ක්‍රි.ව. 1017 දී පළමුවැනි රාජේන්ද්‍ර චෝළ රජු ලංකාව ආක්‍රමණය කොට සිරකරුවකු ලෙස චෝළ දේශයට ගෙන ගිය අනුරාධපුරයේ පාලකයා පහත සඳහන් කවරෙක් ද?
(1) අසේල (2) හතරවැනි මහින්ද (3) පස්වැනි මහින්ද (4) මිත්සෙන්

17. දළද සමිඳුන් ශ්‍රී ලංකාවට වැඩම කරවන විට මෙරට පාලනය කළ රජතුමා කවරකු ද?
(1) මහසෙන් (2) කිත්සිරිමෙවන් (3) වළගම්බා (4) ධාතුසේන

18. ඉතා සියුම් බෑවුමක් සහිත ව ඇළ මාර්ග ඉදිකිරීමට අතීත වාරිමාර්ග ශිල්පීන් සමත් වූ බවට දිය හැකි හොඳ ම නිදසුන වන්නේ මින් කුමක් ද?
(1) අඹන් ගඟේ සිට පරාක්‍රම සමුද්‍රයට ජලය ගෙනයන අංගමැඩිල්ල ඇළ
(2) කලාවැවේ සිට අනුරාධපුර තිසාවැව දක්වා ජලය ගෙන යන යෝධ ඇළ
(3) අනුරාධපුර රන්මසු උයනට ජලය ගෙන ගිය ජලමාතිකාව
(4) කුට්ටම් පොකුණට ජලය ගෙනයාම සඳහා නිර්මිත ජලමාතිකාව

19. ඉන්දියාවෙන් පිටත ප්‍රදේශවලට ද ගුප්ත අධිරාජ්‍යයේ බලය ව්‍යාප්ත කළ ගුප්ත පාලකයා ලෙස සැලකෙන්නේ පහත සඳහන් කවරෙක් ද?
(1) සමුද්‍ර ගුප්ත (2) දෙවැනි චන්ද්‍ර ගුප්ත (3) කුමාර ගුප්ත (4) ස්කන්ධ ගුප්ත

20. දිල්ලි සුල්තාන් අධිරාජ්‍යයේ බලයට පත් වූ රාජ වංශ අනුපිළිවෙළින් දක්වෙන පිළිතුර කුමක් ද?
(1) ඛල්ජි / වහල් / ටුග්ලුග් / සෙයියදු / ලෝඩි (2) වහල් / ඛල්ජි / ටුග්ලුග් / සෙයියදු / ලෝඩි
(3) වහල් / ටුග්ලුග් / ඛල්ජි / ලෝඩි / සෙයියදු (4) ටුග්ලුග් / ඛල්ජි / වහල් / ලෝඩි / සෙයියදු

21. ඉස්ලාම් භක්තිකයකු වුවත් ආගමික සහනශීලිත්වය ජනතාවට ලබා දුන් පාලකයා කවරකු ද?
(1) බාබුර් (2) හුමායුන් (3) මහා අක්බාර් (4) ජහන්ගීර්

22. යාබද පින්තූරයේ දක්වෙනුයේ පොළොන්නරු යුගයට අයත් මූර්තියකි.
එම මූර්තියට බලපා ඇති කලා සම්ප්‍රදාය මින් කුමක් ද?
(1) මෞර්ය
(2) ගුප්ත
(3) පල්ලව
(4) චෝළ



23. මහවැලි ගඟ ගලා බසින නිම්නයේ හා ශ්‍රීපාද මාර්ගයේ සන්ධිස්ථානයක පිහිටි සහ අගනගරය වීමට පෙර උප නගරයක්ව පැවැති ශ්‍රී ලංකාවේ රාජධානිය කුමක් ද?
(1) දඹදෙණිය (2) යාපහුව (3) කුරුණෑගල (4) ගම්පොල

24. පහත සඳහන් ඓතිහාසික සිද්ධීන් අතුරෙන් කවරක් අපරට ශිෂ්ටාචාරය හා සංස්කෘතිය කෙරෙහි දිගුකාලීන බලපෑමක් ඇති කරන ලද්දේ ද?
(1) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පෙදෙස් පෘතුගීසි ආධිපත්‍යයට යටත්වීම
(2) රාජරාජ හා රාජේන්ද්‍ර චෝළ යන පාලකයින් රජරට ප්‍රදේශ යටත් කර ගැනීම
(3) මිහිඳු හිමියන් විසින් මෙරටට බුදු දහම හඳුන්වා දීම
(4) බ්‍රිතාන්‍යයයන් විසින් මුළු රට ම තම ආධිපත්‍යයට නතුකර ගැනීම

25. පහත දක්වෙන කාර්යයන් අතුරෙන් II පරාක්‍රමබාහු රජුගේ කාර්යයන් ඇතුළත් පිළිතුර කුමක් ද?
*A* - දඹදෙණි කතිකාවත සම්පාදනය කිරීම
*B* - බෙලිගල දළදා මාලිගය ඉදි කිරීම
*C* - මහනුවර අස්ගිරි සේනාසනය ආරම්භ කිරීම
*D* - කව්සිළුමිණ හා විශුද්ධි මාර්ග සන්නය රචනා කිරීම
(1) *A* හා *D* (2) *A* හා *C* (3) *B* හා *D* (4) *B* හා *C*

26. මහනුවර රාජ්‍යය තුළ තම බලය තහවුරු කර ගැනීම සඳහා දරූ ප්‍රයත්නයේ දී පෘතුගීසීන් අනුගමනය කළ උපායමාර්ගය මින් කවරක් ද?
(1) කොනප්පුබණ්ඩාරට රජකම ලබා දීම
(2) කුසුමාසන දේවිය තම රැකවරණය යටතේ රජකර වීම
(3) උඩරට රාජධානිය තුළ කතෝලික ආගම ප්‍රචාරය කිරීම
(4) උඩරට භික්ෂූන් වහන්සේලාගේ සහාය ලබා ගැනීම

27. යාපනය ප්‍රදේශයේ අධ්‍යාපන මට්ටම උසස් තත්ත්වයක පැවැතීමට වඩාත් බලපෑ ඓතිහාසික සාධකය මින් කුමක් ද?
(1) අමෙරිකානු මිෂනාරි සමාගම මඟින් යාපනයේ අධ්‍යාපන කටයුතු දියුණු කිරීම සඳහා ලබා දුන් දායකත්වය
(2) එම ප්‍රදේශවල දේශපාලන නායකයන් තුළ අධ්‍යාපනය දියුණු කිරීමට තිබූ දැඩි උනන්දුව
(3) බොහෝ මිෂනාරි සමාගම් තරඟකාරී තත්ත්වයකින් යාපනය ප්‍රදේශයේ අධ්‍යාපන කටයුතු සංවිධානය කිරීම
(4) යාපනයේ භෞතික දුෂ්කරතා නිසා අධ්‍යාපනය තුළින් ජීවන මාර්ග සොයා ගැනීමට තිබූ අවශ්‍යතාව

28. පුනරුද සමයේ විද්‍යාත්මක ක්ෂේත්‍රයේ නව සොයා ගැනීම් I තීරුවේ ද, ඒ හා සම්බන්ධ පුද්ගලයන් II තීරුවේ ද දක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| (i) ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් කිරීම | *A.* ජොහැන්නස් ගුටෙන්බර්ග් |
| (ii) ගුරුත්වාකර්ෂණ නියමය සොයාගැනීම | *B.* ජොහැන්නස් කෙප්ලර් |
| (iii) මුද්‍රණ යන්ත්‍රය නිපදවීම | *C.* ගැලීලියෝ ගැලිලි |
| (iv) දුරදක්නය නිපදවීම | *D.* විලියම් හාවේ |
| | *E.* අයිසැක් නිව්ටන් |

(1) *BEAC* (2) *ACEB* (3) *AEBC* (4) *BECA*

29. "අන්තිම රාත්‍රිභෝජනය" (Last Supper) නමැති ලෝකප්‍රකට චිත්‍රය නිර්මාණය කෙළේ කවරුකු විසින් ද?
(1) රෆායෙල් (2) ඩාන්තේ (3) ලියනාඩෝ ඩාවින්චි (4) බොටිසෙලි

30. "සූර්ය කේන්ද්‍රීය න්‍යාය" ප්‍රථමවරට ඉදිරිපත් කෙළේය'යි සලකනු ලබන්නේ මින් කවර විද්‍යාඥයා ද?
(1) ගැලීලියෝ ගැලිලි (2) ජොහැන්නස් කෙප්ලර්
(3) අයිසෙක් නිව්ටන් (4) නිකොලොයි කොපර්නිකස්

31. දේශ ගවේෂණ ව්‍යාපාරයට සම්බන්ධ වූ ජාතීන් අතුරෙන් මධ්‍යම හා දකුණු අමෙරිකානු ප්‍රදේශවෙත පැමිණ විවිධ උපක්‍රම මඟින් එම රටවල ධනය කොල්ලකෑමෙහි ප්‍රමුඛත්වයක් ගනු ලැබුයේ,
(1) පෘතුගීසි ජාතිකයන් ය. (2) ස්පාඤ්ඤ ජාතිකයන් ය.
(3) ප්‍රංශ ජාතිකයන් ය. (4) ඕලන්ද ජාතිකයන් ය.

32. පහත සඳහන් ඓතිහාසික සිදුවීම් අතුරෙන් කවරක් ප්‍රංශ විප්ලවය හා සම්බන්ධ ද?

*A* - කාබොනාරි ව්‍යාපාරය නමැති සංවිධානය ඇරඹීම

*B* -" ස්ටේට් ජෙනරල්" නමින් හැඳින්වූ මන්ත්‍රණ සභාව කැඳවීම

*C* - බොස්ටන් තේ සාදය

*D* -" බැස්ටිල්" සිරගෙයට පහර දීම

(1) *C* හා *D* (2) *B* හා *C* (3) *B* හා *D* (4) *A* හා *B*

33. ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස්වලට අයත් පුද්ගලයන් රටේ යහපත උදෙසා ජාති, ආගම් භේදයකින් තොරව ක්‍රියාකර ඇති ආකාරය වඩාත් හොඳින් පිළිබිඹු වන්නේ මින් කුමන ව්‍යාපාරය තුළින් ද?

(1) අමද්‍යප ව්‍යාපාරය (2) ජාතික ව්‍යාපාරය

(3) කම්කරු ව්‍යාපාරය (4) වතු වගා ව්‍යාපාරය

34. පහත දක්වෙන ඒවායින් ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ දී මෙරට සිදු වූ වෙනස්කම් පමණක් දක්වෙන පිළිතුර කුමක් ද?

*A* - "පැරිෂ්" පාසල් ආරම්භ කිරීම

*B* - මහාමාර්ග හා දුම්රිය මාර්ග ආරම්භ කිරීම

*C* - රෝම ලන්දේසි නීති ක්‍රමය ඇරඹීම

*D* - ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම

*E* - රාජකාරි ක්‍රමය අහෝසි කිරීම

(1) *BDE* (2) *CDE* (3) *BCE* (4) *ACD*

35. ටොකුගාවා ෂෝගුන් අවධිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය මින් කවරක් ද?

(1) රෝමානු කතෝලික ආගම ජපානයෙන් තුරන් කිරීම

(2) ජපානයේ අගනුවර ටෝකියෝ නගරයට මාරු කිරීම

(3) ජපානයේ වැඩවසම් ක්‍රමය අහෝසි කිරීම

(4) ඡන්ද බලය හඳුන්වා දීම

36. මෙයිජි පාලන ක්‍රමය යටතේ ජපානයේ සම්පාදනය කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් **නොවූයේ** මින් කුමක් ද?

(1) ඩයට් නමැති ද්විමණ්ඩල පාර්ලිමේන්තුව පිහිටුවීම

(2) මූලික අයිතිවාසිකම් පිළිබඳ වගන්ති ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම

(3) ඉඩම් හිමි ධනවත් 1% තරම් වූ පිරිසකට ඡන්ද බලය හිමි වීම

(4) මුදල් කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට අසීමිත බලයක් තිබීම

37. "චීනයේ සාර්ථක ලෙස විප්ලවය කරන්නේ ගොවි ජනතාවයි." මෙය කාගේ අදහසක් ද?

(1) සුන්-යත්-සෙන් (2) චියැං-කායි-ෂෙක්

(3) මාඕ-සේ-තුං (4) චෞ-එන්-ලායි

38. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පැවැති ද්වි මණ්ඩල ක්‍රමය අහෝසි කරන ලද්දේ කිනම් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළින් ද?

(1) ක්‍රි.ව. 1931 (2) ක්‍රි.ව. 1948 (3) ක්‍රි.ව. 1972 (4) ක්‍රි.ව. 1978

39. හබයාස් කෝපුස් ආඥා නිකුත් කිරීමේ බලය හිමි අධිකරණය මින් කුමක් ද?

(1) මහාධිකරණය (2) ශ්‍රේෂ්ඨාධිකරණය (3) අභියාචනාධිකරණය (4) දිසා අධිකරණය

40. පහත දක්වෙන සිදුවීම් අතුරෙන් දෙවැනි ලෝක සංග්‍රාමය හා සම්බන්ධ සිදුවීම් දක්වෙන පිළිතුර කුමක් ද?

*A* - ඇල්සාස්, ලොරේන් ප්‍රදේශ ජර්මනියට ඈඳා ගැනීම

*B* - ජර්මනිය විසින් පෝලන්තය ආක්‍රමණය කිරීම

*C* - මිත්‍ර පක්ෂය හා අක්ෂ පක්ෂය ලෙස ලෝකය පිල් දෙකකට බෙදීම

*D* - සරයේවෝ සිද්ධිය

*E* - ලුසිටානියා නැව ගිල්වා දැමීම

*F* - පර්ල් වරායට පහර දීම

(1) *BCF* (2) *BCE* (3) *CDE* (4) *ACF*

2.1.3. අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 1 | 21 | 3 |
| 02 | 3 | 22 | 4 |
| 03 | 2 | 23 | 4 |
| 04 | 1 | 24 | 3 |
| 05 | 1 | 25 | 1 |
| 06 | 1 | 26 | 2 |
| 07 | 3 | 27 | 1 |
| 08 | 1 | 28 | 1 |
| 09 | 3 | 29 | 3 |
| 10 | 1 | 30 | 4 |
| 11 | 2 | 31 | 2 |
| 12 | 1 | 32 | 3 |
| 13 | 3 | 33 | 2 |
| 14 | 2 | 34 | 1 |
| 15 | 2 | 35 | 1/2 |
| 16 | 3 | 36 | 4 |
| 17 | 2 | 37 | 3 |
| 18 | 2 | 38 | 3 |
| 19 | 2 | 39 | 3 |
| 20 | 2 | 40 | 1 |

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.**

2.1.4. **I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

★ **I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාරය 1 (පිටුව 8) ඇසුරින් සකස් කර ඇත.**

★ අයදුම්කරුවන් 50%ට වඩා අඩුවෙන් නිවැරදිව පිළිතුරු සපයා ඇති ප්‍රශ්න සංඛ්‍යාව 19කි.

★ 50%ට වඩා වැඩියෙන් නිවැරදිව පිළිතුරු සපයා ඇති ප්‍රශ්න සංඛ්‍යාව 21කි.

★ 6,11,21,29, යන ප්‍රශ්නවලට පමණක් 75%කට වඩා නිවැරදිව පිළිතුරු සපයා ඇත.

★ බොහෝ පිරිසක් 30%-60% අතර ප්‍රමාණයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත. මෙය සතුටුදායක මට්ටමකි.

★ සිසුන් හොඳින් පිළිතුරු සපයා නොමැති විෂය කොටස් හඳුනාගෙන එම ක්ෂේත්‍ර පිළිබඳ ඉගැන්වීමේ දී ඉතා සුළු කොටස් පවා ඉගැන්විය යුතුය. (Micro teaching Methodology)

**0-25% අතර අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා ඇති ප්‍රශ්න**

**නිරීක්ෂණ**

★ 3, 5, 22 ප්‍රශ්න සඳහා නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 0-25% අතර පිරිසකි.
★ මෙම ප්‍රශ්න අසා ඇත්තේ ඉතිහාස මූලාශ්‍ර, පැරණි වරායවල් සහ පොළොන්නරු කාලයේ සංස්කෘතිය පිළිබඳව ය. මෙතරම් අඩු ප්‍රමාණයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ ඉහත මාතෘකා පිළිබඳ සිසුන්ට ප්‍රමාණවත් දැනුමක් නොතිබීම හෝ ඔවුන්ට එම මොහොතේ පිළිතුර මතකයට නගා ගැනීමට නොහැකි වීමයි.

**යෝජනා**

★ කාලපරිච්ඡේද අනුව මූලාශ්‍ර වෙන් කර ලැයිස්තුගත කිරීමට සිදුවීම මඟපෙන්විය යුතුය.
★ විවිධ ස්ථානවල සංස්කෘතිය ඉගැන්වීමට එම ප්‍රදේශවලට අධ්‍යාපන චාරිකා රැගෙන යා යුතුය.
★ මෙම ඉතිහාස කරුණු පිළිබඳ පින්තූර එකතු කිරීමට සිසුන් දිරි ගැන්විය යුතුය.
★ එමෙන්ම සිතියම් ලකුණු කිරීම පුහුණු කළ යුතුය.

**26-50% අතර අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා ඇති ප්‍රශ්න**

**නිරීක්ෂණ**

★ 26-50% අතර පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ පහත ප්‍රශ්නවලට ය. 4,10,12,13,15, 19, 20, 23, 25, 26, 27, 30, 31, 33, 36, 38, 39 එම සංඛ්‍යාව 17 කි.
★ මෙම ප්‍රශ්න අදාළ වන්නේ ඓතිහාසික මූලාශ්‍ර, ඉන්දීය අධිරාජ්‍යය, (මෞර්ය, ගුප්ත, කුෂාණ, චෝළ, දිල්ලි සුල්තාන්) නිරිත දිග රාජධානි, වෙරළ බඩ ප්‍රදේශ පෘතුගීසින් පාලනය කිරීම, උඩරට රාජධානිය සමඟ සම්බන්ධය, යාපන රාජධානිය, යුරෝපීය පුනරුදය, නවීන සොයා ගැනීම්, දේශ ගවේශණය, ලංකාවේ ජාතික පුනරුදය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳවයි.

**යෝජනා**

- ඓතිහාසික කරුණු ඇතුළත් චිත්‍රපට බැලීමට, කතාන්දර පොත්, නවකතා කියවීමට සිසුන් උනන්දු කර විය යුතුය.
- විවාද, දැනුම මිනුම තරඟ, පන්ති කාමරය තුළ උසාවියක් පැවැත්වීම හා නාට්‍ය රඟ දැක්වීම යන අංග සඳහා සිසුන් දිරි ගැන්විය යුතුය.

**51-75% අතර අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා ඇති ප්‍රශ්න**

**නිරීක්ෂණ**

- 51-75% පිරිසෙන් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ පහත ප්‍රශ්න 18ට ය. 1, 2, 6, 7, 8, 9, 11, 14, 16, 17, 18, 24, 28, 32, 34, 35, 37, 40.
- මෙම ප්‍රමාණය පිළිබඳව සතුටු විය හැක.
- මෙම ප්‍රශ්නය අදාළ වන්නේ චීන, ජපන් ඉතිහාසය, ප්‍රංශ විප්ලවය, II ලෝක සංග්‍රාමය, ආර්යයන් ඉන්දියාව තුළ ජනාවාස ඇති කර ගැනීම හා ලංකාවට පැමිණ, පැරණි අගනගර පිළිබඳව ය.
- 51-75% ප්‍රමාණයක් මෙම ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සැපයීමට හේතු වන්න ඇත්තේ ඔවුන් 6 ශ්‍රේණියේ සිට මෙම කොටස්වලට ඇලුම් කිරීම ය.

**යෝජනා**

- ඉහත මාතෘකා යටතේ 6-11 දක්වා ශ්‍රේණිවල ඉගෙන ගත් කරුණු එක් වගුවකට ඇතුළත් කිරීම සිසුන් දිරි ගැන්වීම කළ හැක.
- සිතියම් තුළින් හා පිළිතුරු තුළින් සිසුන් චීනය, ජපානය, ප්‍රංශය, ඉන්දියාව වැනි රටවල ඓතිහාසික ස්ථානවලට චාරිකාවක් රැගෙන යා හැකිය.

**76-100% අතර අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා ඇති ප්‍රශ්න**

**නිරීක්ෂණ**

- 21, 29 සඳහා පමණක් 76-100% අතර ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්න අදාළ වන්නේ මහා අක්බර් හා ලියනාඩෝ ඩාවින්චි පිළිබඳව ය. මෙම ක්ෂේත්‍ර නවීන ලෝක ඉතිහාසයට හා සම්බන්ධවීමත් මෙම මාතෘකා යටතේ ඇති කතාන්දරවලට සිසුන් වඩා ඇලුම් කිරීමත් ඉහළ ප්‍රතිශතය නිවැරදිව පිළිතුරු සැපයීමට හේතු වන්නට ඇත.

**යෝජනා**

- මෙම ක්ෂේත්‍රවලට අදාළව රූපවාහිනී වැඩසටහන් පාසල් මට්ටමින් සකස් කර ඉදිරිපත් කිරීමට සිසුන් දිරි ගැන්විය යුතුය.
- මේ හා සම්බන්ධ පින්තූර එකතු කිරීමට දිරි ගැන්විය යුතුය.

## 2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය දෙකකි.

**I, II හා III යනුවෙන් කොටස් තුනකි.**

I කොටස - අනිවාර්ය ප්‍රශ්නයකින් යුක්ත ය. එය "අ" හා "ආ" යනුවෙන් උප කොටස් දෙකකි.

1. අ. (i) ලංකා ඉතිහාසයට සම්බන්ධ ඓතිහාසික ස්ථාන 10ක් ලංකා ආකෘති සිතියමක ලකුණු කිරීම ද,
(ii) ලෝක ඉතිහාසයට සම්බන්ධ ඓතිහාසික ස්ථාන 08ක් ලෝක ආකෘති සිතියමක ලකුණු කිරීම ද අපේක්ෂිත ය.

ලකුණු 10 + 08 = 18 යි.

ආ. කෙටි ප්‍රශ්න 12කින් යුක්ත ය.
ලකුණු ප්‍රමාණය 12 කි.

II කොටස

ලංකා ඉතිහාසයට අදාළ තේමා යටතේ සැකසුන ප්‍රශ්න 5කින් 3ක් තෝරාගෙන පිළිතුරු ලිවීම අපේක්ෂිත ය.

III කොටස

ඉන්දියානු ඉතිහාසය, යුරෝපා හා ඈත පෙරදිග ඉතිහාසයට අදාළ තේමාවලින් සැකසුන ප්‍රශ්න 4කින් දෙකකට පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.

II හා III කොටස්වල සෑම ප්‍රශ්නයක් ම I, II, III, IV වශයෙන් අනු කොටස්වලට බෙදා ඇති අතර එම කොටස්වලට පිළිවෙළින් 3+4+5+6 බැගින් ලකුණු හිමි වේ. සෑම ප්‍රශ්නයකට ම මුළු ලකුණු ගණන 18 කි.

අවසාන ලකුණු ගණනය

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | - | ලකුණු | 80 |
| II පත්‍රය | - | ලකුණු | 120 |
| | | | 200 |

අවසාන ලකුණු 200 ÷ 2 = 100

2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන

★ II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3 සහ 4.1, 4.2 හා 4.3 ඇසුරින් සකස් කර ඇත.

## I කොටස

**1.** **(අ)** පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) පරාක්‍රම සමුද්‍රය, ඉරණමඩු වැව, මැණික් ගඟ, අනුරාධපුර, ඌරාතොට, ගොඩවාය, ගාල්ල, මහියංගනය, ගන්නොරුව, සීතාවක *(ලකුණු10 යි)*

(ii) කාවේරි ගංගාව, ඊඩෝ (ටෝකියෝ), රතු මුහුද, ගෝව, මලය අර්ධද්වීපය, තායිවානය (ෆෝර්මෝසා) හොවැංහෝ ගඟ, කාබුල් *(ලකුණු 08 යි)*

**(ආ)** (i) පහත *A, B, C, D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැ'යි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ක්‍රි. ව. දෙවැනි ශතවර්ෂයේ දී පමණ ලංකාවේ සිතියමක් නිර්මාණය කළ ග්‍රීක ජාතික භූගෝල විද්‍යාඥයා

*B* - ක්‍රි. ව. පස්වැනි සියවසේ දී ලංකාවට පැමිණ අභයගිරි විහාරයේ වසර දෙකක් පමණ ගතකොට ශ්‍රී ලංකාව ගැන ද තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් සම්පාදනය කළ චීන භික්ෂූන් වහන්සේ


*C* - නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමෙහි ලා මුල් වී කටයුතු කළ ඉන්දියානු අග්‍රාමාත්‍යවරයා

*D* - සූවස් ඇළ ජනසතු කිරීමට මුල් වූ ඊජිප්තු (මිසර) ජනාධිපතිවරයා *(ලකුණු 04 යි)*

(ii) යාබද *A* සහ *B* යටතේ දක්වා ඇති කලා නිර්මාණ හොඳින් අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

1. ලෝක උරුමයක් ලෙස සැලකෙන මෙම නිර්මාණය කුමක් ද?
2. මෙය ගොඩනංවන ලද රජතුමා කවු ද?
3. කවරකු සිහිවීම සඳහා මෙය නිර්මාණය කරන ලද්දේ ද?
4. මෙම ස්මාරකය ඉදිකිරීම සඳහා මූලික වශයෙන් යොදාගෙන ඇති පාෂාණ වර්ගය කුමක් ද?

*(ලකුණු 04 යි)*




(iii)
1. මෙම නිර්මාණය කුමක් ද?
2. මෙවන් නිර්මාණ දකිය හැක්කේ කවර ගොඩනැගිලි අබියස ද?
3. මෙහි නිරූපිත සිවුපා සතුන් අතුරෙන් **එක්** සතකු නම් කරන්න.
4. මෙහි මධ්‍යයේ නිරූපිත පුෂ්පය කුමක් ද?


*(ලකුණු 04 යි)*



අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය


## 1 ප්‍රශ්නය

(1) (අ) (i)




(ලකුණු 10)

(1) (ඈ) (ii)




(ලකුණු 08)

(ආ) (i) A - කලෝඩියස් ටොලමි/ ටොලමි
B - පාහියන් භික්ෂුව
C - ශ්‍රී ජවහර්ලාල් නේරුතුමා/ නේරුතුමා
D - අබ්දුල් ගමාල් නසාර්/ නසාර්

(ලකුණු 1 × 4 = 04)

(ආ) (ii) 1. ටජ්මහල්
2. ෂාජහාන් රජ
3. මුම්ටාස්මහල් දේවිය/ සාජහාන් දේවිය/ මුම්ටාස් දේවිය
4. කිරිගරුඬ/ මාබල් (ලකුණු 1 × 4 = 04)

(iii) 1. සඳකඩ පහන
2. ආගමික ගොඩනැගිලි අබියස/ පිළිම ගෙවල්/ විහාර ගෙවල්
3. ගොනා/ වෘෂභ/ ගවයා/ සිංහයා/ අශ්වයා/ ඇතා/ අලියා/ හස්තියා
4. නෙළුම් මල/ සියපත (ලකුණු 1 × 4 = 04)

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එහෙත් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලියූ අපේක්ෂකයින් 99%ක් පමණ විය. (ප්‍රස්තාරය 2 ඇසුරෙනි.)

- ★ පළමු ප්‍රශ්නයට හිමි ලකුණු ප්‍රමාණය 30කි. ඉන් 0 - 7 අතර ලකුණු ලබාගත් ප්‍රමාණය 23%කි. 8 - 15 ත් අතර ප්‍රමාණය 51%කි. 16 - 22 අතර ලකුණු ලබාගත් අයදුම්කරුවන් ප්‍රමාණය 21%කි. 23 - 30 අතර ලකුණු ලබාගත් අයදුම්කරුවන් ප්‍රමාණය 5%කි. (ප්‍රස්තාරය 3 ඇසුරෙනි)

- ★ I ප්‍රශ්නයේ "අ" කොටසට අයත් ශ්‍රී ලංකාව හා ලෝක සිතියම ලකුණු කිරීම ඉතා දුර්වල මට්ටමක පැවති බව පැහැදිලි ය. ශ්‍රී ලංකා සිතියම නිවැරදිව ලකුණු කර ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 28%ක් පමණ ය. ලෝක සිතියම නිවැරදිව ලකුණු කළ අයදුම්කරුවන් ගණන 18%ක් පමණ විය. සිතියම් ලකුණු කිරීමේ භෞතික ලක්ෂණ හා ඓතිහාසික ස්ථානවල නිවැරදි පිහිටීම දැක්වීමේ හැකියාව දුර්වල මට්ටමක පැවති බව පෙනී යයි.

- ★ I ප්‍රශ්නයේ "ආ" කොටසේ (i), A, B, C, D යන අනු කොටස්වලින් අපේක්ෂකයින් වැඩි ප්‍රමාණයක් පිළිතුරු සපයා ඇත්තේ A කොටසටයි. එය 68%ක් වේ. B කොටස සඳහා 39%ක් ද, C කොටස සඳහා 42%ක් ද, D කොටස සඳහා 25%ක් ද නිවැරදි පිළිතුරු සපයා ඇත.

- ★ I ප්‍රශ්නයේ "ආ" කොටසේ (ii) හි 1 සඳහා නිවැරදි පිළිතුරු සැපයූ ප්‍රමාණය 89%ක් ද, 2 කොටස සඳහා 76%ක් ද, 3 කොටස සඳහා 69%ක් ද, 4 කොටස සඳහා 51%ක් ද විය. 1 ප්‍රශ්නයේ (iii) කොටසෙහි 1,3 කොටස් සඳහා 94%ක් ද, 2 කොටසට 68%ක් ද, 4 කොටසට 79%ක් ද, සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

- ★ ගුරුවරුන් ඉතිහාසය ඉගැන්වීමේ දී ඓතිහාසික ස්ථාන හැඳින්වීමට භාවිත කරන විවිධ නම් පිළිබඳ සිසුන් දැනුවත් කළ යුතුය. ඓතිහාසික ස්ථාන පිළිබඳ ඉගැන්වීමේ දී එම ස්ථාන පිළිබඳව ඓතිහාසික කරුණු, විශේෂත්වය හා වැදගත්කම් පිළිබඳ ඉගැන්විය යුතු අතර ඒ පිළිබඳ සිසුන් තුළ ඇල්මක් ඇතිවන ලෙස පාඩම් සැලසුම් කළ යුතුය. ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්ථාන නැරඹීමට හැකි අවස්ථාවල සිසුන් රැගෙන යා යුතුය.

## 2 ප්‍රශ්නය

02. අපේක්ෂණය : ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පාලන සංවිධානය හා වාරි කර්මාන්තවල වර්ධනය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම

**II කොටස**

**2.** "මෙරට පැවැති ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිපාලන රටාවත්, වාරිමාර්ග තාක්ෂණයත්, ඉතා උසස් මට්ටමක පැවැතිණි."

(i) ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පැවැති අනුරාධපුර පොළොන්නරු යුගවල දී

*A* - ගමක පාලකයා

*B* - රුහුණු දේශයේ පාලකයා

*C* - මායා රටේ පාලකයා

ඉහත *A*, *B* සහ *C* වලින් දක්වෙන එක් එක් පුද්ගලයා හැඳින් වූ නිල නාමය කුමක්ද'යි දක්වන්න. *(ලකුණු 03 යි)*

(ii) පහත දක්වෙන ඒ ඒ කාර්යයන් සඳහා ගොඩනංවන ලද තාක්ෂණික නිර්මාණ මොනවාද'යි දී ඇති ලැයිස්තුවෙන් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

*A* - වැවක අතිරික්ත ජලය පිට කිරීම

*B* - ප්‍රධාන වැවක ඉස්මත්තෙහි ඇති කුඩා දියපාරවල්වලින් වැවට එකතු වන රොන්මඩ පාලනය කිරීම

*C* - ඇළක් මගින් ජලය ගෙනයාම සඳහා ගඟ හරස් කොට ගල් කුට්ටි යොදා තැනූ බාධකය

*D* - වැවෙහි ජල පීඩනය සමනය කොට සොරොව්ව තුළින් ප්‍රධාන ඇළට ජලය නිකුත් කිරීම

**(දනවාපි, මොගොළ, රළපනාව, කුළුවැව්, අමුණ, ගොඩ සොරොව්ව, බිසෝ කොටුව, කලිඟු බැම්ම, පිටවාන)** *(ලකුණු 04 යි)*

(iii) ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පැවැති යුගයේ දී එහි මධ්‍ය පාලකයා වූ රජතුමාගෙන් රටවැසියන් කෙබඳු සේවාවක් බලාපොරොත්තු වූයේද'යි කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

(iv) අපේ පැරණි වාරිමාර්ග ශිල්පීන් වාරිමාර්ග නිර්මාණය සඳහා භූ විෂමතා ලක්ෂණ උපයෝගී කරගත් ආකාරය නිදසුන් ඉදිරිපත් කරමින් පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) A - ගමික/ පරුමක/ ග්‍රාමභෝජක/ ගමණි/ ගාමණී/ ග්‍රාමණී
B - ඈපා/ රෝහණ බෝජක/ ආදිපාද
C - මාපා/ මහාදිපාද

**(ලකුණු 1 × 3 = 03)**

(ii) A - පිටවාන
B - කුළුවැව්
C - අමුණ
D - බිසෝකොටුව

**(ලකුණු 1 × 3 = 03)**

(iii)
- ★ රට වැසියන් ආරක්ෂා කිරීම : අභ්‍යන්තර සතුරු බලවේගවලින් මෙන්ම බාහිර සතුරු බලවේගවලින් ද රටවැසියා ආරක්ෂා කර ගැනීම හා රටේ සාමය පවත්වා ගැනීම.
- ★ ගොවිතැන් කටයුතු සඳහා වාරි කර්මාන්ත පහසුකම් සැලසීම : වැව් අමුණු ඉදිකරවීම, ඇළ මාර්ග ඉදි කරවීම ආදිය මගින් ගොවිතැනට ජලය සපයා දීමේ කාර්යයෙහි ප්‍රමුඛත්වය ගෙන කටයුතු කිරීම.
- ★ ආගමික හා සංස්කෘතික කටයුතු දියුණු කිරීම : බුදු දහම ආරක්ෂා කිරීම, වෙහෙර විහාර ඉදි කරවා ආගමික කටයුතු සඳහා රට වැසියාට පහසුකම් සලසා දීම. විවිධ වූ කලාත්මක නිර්මාණ බිහි කිරීම සඳහා දක්ෂතා ඇති ශිල්පීන්ට ඒ සඳහා රාජ අනුග්‍රහය ලබා දීම හා ඔවුන්ගේ කාර්යයන් අගය කිරීම.
- ★ රජතුමා පාලන කටයුතු කිරීමේ දී මහා සංඝයා වහන්සේලාගේ මෙන් ම පුරෝහිත, සේනාපති සහ ඇමතිවරුන් ආදී ප්‍රභූන්ගේ උපදෙස් ලබාගෙන දසරාජ ධර්මය සැලකිල්ලට ගෙන පාලන කටයුතු මෙහෙයවීම රජුගේ කාර්යයක් වීම.

* අධිකරණ පද්ධතියේ නායකයා වශයෙන් කටයුතු කිරීම.

**මෙවැනි කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කිරීම සඳහා : කරුණු දෙකකට ලකුණු 02**

**විස්තර කිරීමට ලකුණු 03**

**මුළු ලකුණු = 05**

(iv) පැරණි වාරි ශිල්පීන් වාරිමාර්ග නිර්මාණය සඳහා භූ විෂමතා ලක්ෂණ උපයෝගි කරගත් ආකාරය :

* වැව් තැනීම :
  * වියළි කලාපයේ යෝග්‍ය භූ විෂමතා ලක්ෂණ උපයෝගි කොට ගෙන වාරි කර්මාන්ත ඉදි කිරීම. හෙල්වැටි විහිදීම හා හෙල්වැටි අතරින් ගලා බසින ගංගා තිබීම. එසේ හෙල්වැටියක් කපාගෙන ගඟක් ගලා බසින ස්ථානයක දී එම හෙල්වැටියේ නෙරු දෙක සම්බන්ධ කර බැම්මක් බැඳ වැවක් තැනීම.
  * වැවක් ඉදි කිරීමේ දී වැව් බැම්ම නිර්මාණය කිරීම සඳහා එකිනෙකට ලංව පිහිටි කඳු ගැට දෙකක් සම්බන්ධ කොට වැව නිර්මාණය කිරීම.
  * වැව් බැම්ම නිර්මාණය කිරීමේ දී පොළාවේ පාෂාණ සංයුතිය ගැන ද සැළකිලිමත් වූ බව. (නිද: මින්නේරිය වැව් බැම්ම ස්ථානගත කර ඇත්තේ පොළොවේ)
  * වැව් බැම්ම නිර්මාණය කිරීමේ දී පාෂාණ ස්ථරවල ආනතිය වැව ඇතුළට නැමී පවතින අවස්ථාවක් තෝරා ගැනීම නිසා වැව් බැම්මෙන් ජලය කාන්දු වීම වැළකේ.
  * සමෝච්ඡ රේඛා විහිදීම අනුව වැව් බැම්ම නිර්මාණය කිරීම.
    (නිද: පරාක්‍රම සමුද්‍රයේ වැව් බැම්ම)
  * කඳු රහිත ප්‍රදේශවල භූමියේ පිහිටීම අනුව වැව් තනා තිබීම. (නිද: මන්නාරම් දිස්ත්‍රික්කයේ යෝධ වැවේ බැම්ම සැ. 07ක් පමණ දිග චාපයක් ලෙස නිර්මාණය කර ඇත.
  * සොර බොර වැවේ සොරොච්චි, පිහිටි කලුගල කපා නිර්මාණය කිරීම.

* ඇළ මාර්ග නිර්මාණය කිරීම :
  * වියළි කලාපීය තැනිතලාවේ බෑවුම අනුව ඇළවල් කැපීම සඳහා යෝග්‍ය භූ විෂමතාවක් තිබීම. ඒ අනුව භූමියේ හැඩතල අවබෝධ කොටගෙන දිග ඇළ මාර්ග සකස් කිරීම.
  * ඇළ මාර්ග නිර්මාණය කිරීමේදී සුළු බෑස්මක් ඔස්සේ විශාල දුරකට ජලය ගෙන යාම. (නිද: කලා වැවේ සිට යෝධ ඇළ දිගේ කිලෝ මීටරයකට මි.මී.95 ක බෑස්මක් යටතේ ජලය ගෙන යාම.

* අමුණු ඉදිකිරීම :
  * ගංගාවක් දඟර ගැසෙමින් වක්කලමක හැඩයට ගලා බැසීම නිසා ජල පහරේ වේගය අඩුවන ස්ථාන තෝරා ගෙන හරස්කර වේළි තැනීම.
    (නිද: අංගමැඩිල්ලේ දී අඹන් ගඟ හරස් කර පරාක්‍රම සමුද්‍රයට ජලය ගෙන යාම.
    මහවැලි ගඟෙන් මිනිපේ ඇළට ජලය ලබා දීම.)
  * භූමියේ බෑස්ම හා ජලවහන රටාවට අනුව ඒකාබද්ධ වූ වැව් හා ඇළ මාර්ග පද්ධතියක් නිර්මාණය කිරීම.
    (නිද: මල්වතු ඔය සහ වලවේ ගං ආශ්‍රිත වැව් හා වාරි පද්ධතිය (එල්ලංගාව)
    මෙවැනි කරුණු තුනක් නිදසුන් සහිතව විස්තර කර තිබිය යුතුය.
    නිදසුන් සහිතව එක් කරුණක් විස්තර කිරීමට ලකුණු දෙක බැගින් කරුණු තුනට

**(ලකුණු 2 × 3 = 06)**

පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

92%ක් පමණ අපේක්ෂකයින් පිරිසක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 18කි. 0-4 අතර ඇතුළත් වූ නිවැරදි පිළිතුරු සැපයූ අපේක්ෂකයින් සංඛ්‍යාව 36%කි. 5-9 ලකුණු අතරට ඇතුළත් වූ නිවැරදි පිළිතුරු සැපයූ අපේක්ෂකයින් සංඛ්‍යාව 38%කි. 10-13 අයත් වූ සංඛ්‍යාව 18%ක් ද, 14-18 9%ක් ලකුණු අතර පිළිතුරු සපයා තිබුණි.

මෙම ප්‍රශ්නයෙහි (i) කොටස සඳහා නිවැරදි පිළිතුරු වැඩි ප්‍රමාණයක් ලබා ගෙන ඇත්තේ A සඳහා වන අතර එය 70% කි. B, C සඳහා 21-22% අතර ලකුණු ලබා ඇත. (ii) කොටසේ A සඳහා 71%ක් ද, B, C සඳහා 38% බැගින් ද, D සඳහා 55% ක් ද නිවැරදි පිළිතුරු සපයා ඇත.

(iii) කොටස සඳහා 48%ක් නිවැරදි පිළිතුරු සපයා තිබූ අතර, (iv) කොටස සඳහා 29% ක් විය. මෙම කොටස් දෙකම කරුණු විස්තර කිරීමෙන් ලකුණු ලබාගත හැකි වුවද සාර්ථක පිළිතුරු සැපයීමට අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙකු අසමත් වී ඇත.

- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පාලන සංවිධානය හා වාරි කර්මාන්තවල වර්ධනය පිළිබඳව 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඉගෙනගත් කරුණු එක් වගුවකට ඇතුළත් කිරීමට සිසුන් මෙහෙයවීම තුළින් ඔවුන්ට වාරි කර්මාන්තයේ වර්ධනය පිළිබඳ වඩා හොඳ දැනුමක් හා අවබෝධයක් ලබා ගත හැක.
- ඉහත කරුණු ඉගැන්වීමේ දී උචිත දෘශ්‍යාධාරක (පින්තූර) භාවිත කිරීමට ගුරුභවතුන් සැලකිලිමත් විය යුතුය.
- ක්ෂේත්‍ර චාරිකාවක් සැලසුම් කොට ඉපැරණි වැවක කොටස් පෙන්වීමට රැගෙන යා යුතුය.

## 3 ප්‍රශ්නය

03. අපේක්ෂණය : අනුරාධපුර රාජධානි සමය තුළ ලංකා ඉතිහාසයේ හටගත් දේශපාලන ආර්ථික හා සංස්කෘතික වෙනස්කම් පිළිබඳ තුලනාත්මක අවබෝධය පිරික්සීම.

**3.** "අනුරාධපුර රාජධානි සමය ලංකා ඉතිහාසයේ කැපී පෙනෙන දේශපාලන, ආර්ථික හා සංස්කෘතික වෙනස්කම් රැසක් සිදු වූ අවධියකි."

(i) අනුරාධපුරය රාජධානිය කරගත් රජවරුන් තිදෙනකු පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරා ලියා දක්වන්න.
**(කාවන්තිස්ස / ධාතුසේන / II ගජබාහු / I අග්බෝ / නිශ්ශංකමල්ල / V මිහිඳු)** *(ලකුණු 03 යි)*

(ii) *A* - පුළුහත්ථ ඇතුළු දකුණු ඉන්දීය ආක්‍රමණිකයන් සත්දෙනා ලංකාවට පැමිණි අවධියේ අනුරාධපුර රාජධානිය පාලනය කිරීම

*B* - ප්‍රථම වරට ලම්භකර්ණ පෙළපතට රාජ්‍ය බලය ලබා ගැනීම

*C* - ලංකාවේ විශාලතම ස්තූපය වූ ජේතවන දාගැබ ඉදිකරවීම

*D* - කන්තලේ හා ගිරිතලේ යන වැව් තැනවීම

ඉහත *A, B, C, D* වලින් දක්වෙන එක් එක් කාර්යය හා සම්බන්ධ රජතුමා කවුරුද්'යි අනුපිළිවෙළින් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) "වළගම්බා රාජ්‍ය සමය ආගමික වශයෙන් වැදගත් සිදුවීම් ගණනාවක් හටගත් කාලපරිච්ඡේදයකි." නිදසුන් **දෙකක්** දක්වමින් ඒ බව පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

(iv) "මහසෙන් රජතුමා ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ වාරි කර්මාන්ත දියුණුවට වැදගත් මෙහෙයක් ඉටු කළ පාලකයෙකි." ඔහු විසින් කරවන ලද වැව් **දෙකක්** හා ඇළ මාර්ගයක් නම් කොට වාරිකර්මාන්ත දියුණුවට සිදු කළ සේවය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) ධාතුසේන
I අග්බෝ
V මිහිඳු **(ලකුණු 1 × 3 = 03)**

(ii) A - වළගම්බා/ වට්ට ගාමිණී අභය
B - වසභ
C - මහසෙන්/ මහාසේන
D - II අග්බෝ **(ලකුණු 1 × 4 = 04)**

(iii) වළගම්බා රාජ්‍ය සමයේ ආගමික වැදගත්කම :

★ <u>අභයගිරි විහාරය ඉදි කරවීම</u>
(සතුරන්ගෙන් බේරී පලා යද්දී රජුට අවමන් කළ ගිරි නම් නිඝණ්ඨයා විසූ අරම පිහිටි ස්ථානයේ මෙම විහාරය ඉදිකරවන ලද බව සැලකේ.)

★ <u>ශ්‍රී ලංකාවේ ප්‍රථම පෞද්ගලික ආරාම පූජාව සිදුවීම.</u>
(සතුරන් නසා ලංකා රාජ්‍යය නැවත ලබාගත් වළගම්බා රජු, සැඟව සිටියදී තමනට උපකාර කළ කුප්පිකල මහාතිස්ස තෙරුන්ට අභිනවයෙන් තනන ලද අභයගිරි විහාරය පූජා කරන ලදී. එය ලංකාවේ සිදු වූ ප්‍රථම පෞද්ගලික ආරාම පූජාවයි.)

★ <u>ලංකාවේ ප්‍රථම වරට නිකාය භේදයක් හට ගැනීම.</u>
(වළගම්බා රජු විසින් අභයගිරි විහාරය පූජා කරනු ලැබූ කුප්පිකල මහාතිස්ස තෙරුන් විනය කර්මයක් නිසා මහා විහාරයෙන් නෙරපා හරිනු ලැබූවෙකු වූ අතර උන් වහන්සේගේ ශිෂ්‍ය වහලමසුතිස්ස හිමි සමඟ පන්සියයක් භික්ෂූන් වහන්සේලා අභයගිරියෙහි වාසයට පැමිණ "අභයගිරි නිකාය" පිහිටුවා ගත්හ. මේ නිසා ප්‍රථමවරට සංඝ භේදයක් හට ගැනීම හා නිකාය භේදයක් සිදුවීම ද විය.)

★ <u>ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම</u>
මෙතෙක් කල් මුඛ පරම්පරාගතව පැවතගෙන ආ ත්‍රිපිටක ධර්මය මාතලේ අළු විහාරයේ දී ග්‍රන්ථාරූඪ කිරීම සිදුවිය.

★ <u>ලෙන් විහාර රැසක් පිහිටුවාලීම</u>
වළගම්බා රජු සතුරන්ගෙන් බේරී සැඟව සිටීමට භාවිත කළ ගල් ලෙන් රැසක් නැවත ලංකා රාජ්‍යය ලබාගත් පසු ලෙන් විහාර බවට පත් කළේය. දඹුල්ල වැනි ලෙන් විහාර එසේ ගොඩ නඟන ලද ඒවායි.
**මෙවැනි කරුණු දෙකක් නිදසුන් සහිතව දැක්විය යුතුය.**

**නිදසුන් දෙකට ලකුණු 02**
**විස්තර කිරීමට ලකුණු 03**
**මුළු ලකුණු = 05**

(iv) මහසෙන් රජුගෙන් වාරිකර්මාන්තවලට සිදු වූ සේවය :

★ වැව් 16ක් ඉදි කිරීම - මින්නේරිය, හුරුළු වැව, කවුඩුල්ල, මහකනදරාව, මාගල්ල (මහාදාරගල්ල), මහගල්කඩවල වැනි වැව් රැසක් ඉදි කරවීම.

★ ඇළහැර ඇළ විශාල කිරීම - ඇළහැර, මින්නේරි, කවුඩුලු ඒකාබද්ධ වාරිමාර්ග පද්ධතිය ඉදිකිරීම.

★ පබ්බතන්ත ඇළ ඉදි කරවීම.

- ★ මින්නේරිය වැව ඉදි කරවීමෙන් වාරි කර්මාන්ත ක්ෂේත්‍රයට ඉටු කළ මෙහෙය නිසා "මින්නේරි දෙවියන්" ලෙස වැඳුම් ලැබීම.

**වැව් දෙකක් හා ඇළ මාර්ගයක් නම් කිරීමට ලකුණු 03**

**සේවය විස්තර කිරීමට ලකුණු 03**

**මුළු ලකුණු = 06**

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙයට පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇති අපේක්ෂකයින් ගණන 83%කි. (2 ප්‍රස්තාරය ඇසුරෙනි)

මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 18කි. 0-4 අතර ඇතුළත් වූ නිවැරදි පිළිතුරු සැපයූ අපේක්ෂකයින් සංඛ්‍යාව 35%කි. 5-9 ලකුණු අතරට ඇතුළත් වූ නිවැරදි පිළිතුරු සැපයූ අපේක්ෂකයින් සංඛ්‍යාව 33%කි. 10-13 අතර ලකුණුවලට ඇතුළත් වූ සංඛ්‍යාව 19%ක් ද, 14-18 ලකුණු අතරට ඇතුළත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව 12%ක් ද විය. (3 ප්‍රස්තාරය ඇසුරෙනි)

මෙම ප්‍රශ්නයේ (i) කොටස සඳහා ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ඇති අතර, එය 58%ක් පමණ වේ. (iii) කොටස හා (iv) කොටස් සඳහා කරුණු විස්තර කළ යුතු ප්‍රශ්න වන අතර (iii) කොටසට නිවැරදි පිළිතුරු සපයා තිබූ අයදුම්කරුවන් සංඛ්‍යාව 45%කි. (iv) කොටසට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 38%ක වැනි අයදුම්කරුවන් පිරිසකි.

මෙම ප්‍රශ්නයෙහි (ii) කොටස සඳහා නිවැරදි පිළිතුරු සැපයීමට සමත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව තරමක් දුරට අඩු මට්ටමක පැවතීමට හේතුව රජවරුන් හා සම්බන්ධ ක්‍රියාදාමය පිළිබඳ දැනුම මඳකම බවට අනුමාන කළ හැකිය.

- ★ ශ්‍රී ලංකාවේ රජවරු පිළිබඳ කතාන්දර පොත් කියවීමට සිසුන් පෙළඹවීම ගුරුවරුන් විසින් කළ යුතුය.
- ★ රජවරු පිළිබඳ යම් යම් කතා පන්ති කාමරය තුළ රඟ දැක්වීමට සිසුන් ධෛර්යමත් කළ යුතු අතර, එම පුරාවෘත්ත ඇතුළත් රූපවාහිනි කතා, වේදිකා නාට්‍ය හා චිත්‍රපටි බැලීමට සිසුන් යොමු කළ යුතුය.
- ★ රජවරු පිළිබඳ චිත්‍ර ඇතුළත් විවරණයක් කිරීමට සිසුන් උනන්දු කළ යුතුය.
- ★ හැකි සෑම විටම ඓතිහාසික ස්ථාන පෙන්වීමට සිසුන් රැගෙන යා යුතුය.

## 4 ප්‍රශ්නය

04. අපේක්ෂණය : පොළොන්නරුව බිඳ වැටීමෙන් පසු බිහි වූ රාජධානිවල දේශපාලන හා ආර්ථික රටාවේ වෙනස්වීම් පිළිබඳ දැනුම හා තුලනාත්මක අවබෝධය මැනීම.

**4.** "පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසු පැරණි ලංකාවේ රාජධානිවල, අගනුවරවල් වරින් වර වෙනස්වීම, දේශපාලන මෙන් ම ආර්ථික රටාවේ වෙනස්කම් කෙරෙහි ද බෙහෙවින් බලපෑ සිද්ධියක් විය."

(i) *A* - පළමුවැනි බුවනෙකබාහු
*B* - දෙවැනි බුවනෙකබාහු
*C* - හතරවැනි බුවනෙකබාහු

ඉහත නම් සඳහන් රජවරුන් රජකළ රජධානි මොනවාද'යි වරහන් තුළ ඇති නම්වලින් තෝරා *A, B, C* අනුපිළිවෙළින් ලියා දක්වන්න. **(යාපහුව, දඹදෙණිය, කුරුණෑගල, ගම්පල, කෝට්ටේ)** *(ලකුණු 03 යි)*

(ii) *A* - කෝට්ටේ බලකොටුව ඉදිකළ පුද්ගලයා
*B* - ක්‍රි. ව. 1411 දී රයිගම පාලනය කළ වීර අලකේශ්වර පරාජය කොට ඔහු සිරකරුවකු ලෙස චීනයට ගෙන ගිය චීන සෙන්පතියා
*C* - සිංහල හා දෙමළ ජනයා අතර සාමකාමී සම්බන්ධතා පවත්වාගෙන යාම නිසා වැසියන් අතර බොහෝ ජනප්‍රිය වූ යාපනයේ පාලකයා
*D* - යාපනයේ රාජධානිය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ප්‍රධාන මූලාශ්‍ර ග්‍රන්ථය

ඉහත *A, B, C* වලින් දක්වෙන එක් එක් සිද්ධිය හා සම්බන්ධ පුද්ගලයාගේ නම ද *D* වලින් අසා ඇති මූලාශ්‍ර ග්‍රන්ථයෙහි නම ද පිළිවෙළින් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) කෝට්ටේ රජකළ රජවරුන් අතුරෙන් හයවැනි පරාක්‍රමබාහු රජතුමා වඩාත් වැදගත් වන්නේ ඇයිද'යි කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

(iv) රජරට සිට නිරිත දෙසට රාජධානිය විතැන්වීමත් සමඟ ආර්ථික රටාව ද වෙනස් වූ ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) A - යාපහුව
B - කුරුණෑගල
C - ගම්පොල (ලකුණු 1 × 3 = 03)

(ii) A - නිශ්ශංක අලගක්කෝනාර/ නිශ්ශංක අලකේශ්වර
B - චෙං හෝ
C - වරෝදය
D - යාල්පාන වෛපමාලෙයි (ලකුණු 1 × 4 = 04)

(iii) කෝට්ටේ හයවැනි පරාක්‍රමබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය

- ⋆ අවසන්වරට මුළු ලංකාවම එක්සේසත් කළ සිංහල රජතුමා වීම.
- ⋆ යාපනේ රාජ්‍යය ඈඳා ගෙන වන්නි ප්‍රදේශවල නායකවරු අවනත කොට මලය ප්‍රදේශයේ හටගත් කැරලි මර්ධනය කොට රටේ සාමකාමී පාලනයක් ඇති කිරීම.
- ⋆ රටේ ආර්ථික සමෘද්ධිය ඇති කිරීම.
- ⋆ විදේශයන්හි ද ආධිපත්‍යය පැතිරවීම - වෙළෙඳ ගණුදෙනුවක් මුල්කරගෙන දකුණු ඉන්දියාවේ අතිවිරරාම් පට්ටන ආක්‍රමණය කිරීම, විජය නගර අධිරාජ්‍යයේ තොටුපලක් ආක්‍රමණය කිරීම.
- ⋆ සාහිත්‍යයේ උන්නතියට කළ සේවය - සාහිත්‍යයේ ස්වර්ණමය අවධිය බවට පත්වීම, ඒ සඳහා හය වන පරාක්‍රමබාහු රජුගෙන් ලද අනුග්‍රහය, පිරිවෙන් අධ්‍යාපනයේ දියුණුව, සිය මෑණියන් සිහිවීම සඳහා පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන කරවීම.
- ⋆ පද්‍යමය සිංහල "රුවන්මල" නිඝණ්ඩුව රජතුමා විසින් රචිත ග්‍රන්ථයක් බව කියනු ලැබේ.

මෙවැනි කරුණු දෙකක් ඇසුරින් විස්තර කිරීමට
කරුණු දෙකට ලකුණු 02
විස්තර කිරීමට ලකුණු 03
මුළු ලකුණු = 05

(iv) රජරට සිට නිරිත දෙසට රාජධානිය විතැන්වීමත් සමඟ ආර්ථික රටාවද වෙනස් වූ ආකාරය :

- ⋆ රජරට ප්‍රදේශයේ සිට නිරිත දෙසට රාජධානි විතැන්වීමත් සමඟ නව භූගෝලීය පරිසරයකට මුහුණදීමට ජනතාවට සිදුවීම.
- ⋆ මහවැව් හා වාරිමාර්ග ඉදි කිරීමට රජවරුන් උනන්දු නොවීම හා තෙත් කලාපීය ප්‍රදේශ නිසා ඒවා එතරම් අවශ්‍ය නොවීම. කෘෂි කාර්මික කටයුතුවලට අහස් දිය යොදා ගැනීම.
- ⋆ වී ප්‍රධාන වගාව
- ⋆ ජලය හිඟ ප්‍රදේශවල හේන් වගාව
- ⋆ මද උස්බිම්වල පොල්, පුවක්, ගම්මිරිස්, බුලත් වැනි බෝග වගාව
- ⋆ තෙත් කලාපීය වෙරළබඩ පොල් වගාව ප්‍රචලිත විය.
- ⋆ තෙත් කලාපයේ වනගතව වැවුන කුරුඳු වෙළෙඳ බෝගයක් ලෙස වැදගත් වීම.
- ⋆ වෙළෙඳාම ප්‍රචලිත වීම - කුරුඳු, පුවක්, ගම්මිරිස්, සාදික්කා හා එනසාල් ද මුතු මැණික් ඇතුන් හා ඇත් දළ අපනයන භාණ්ඩ විය.
- ⋆ ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පැවති ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාව වාණිජ්‍ය නිර්යාත ආර්ථික රටාවකට පරිවර්තනය ආරම්භ වීම දක්නට ලැබිණි.
- ⋆ ඉන්දියාව, අරාබිය, චීනය, පර්සියාව හා ඊජිප්තුව සමඟ වෙළෙඳ සබඳතා වර්ධනය වීම. (ඉන්දියාවෙන් කසීසළු, චීනයෙන් පිඟන් භාණ්ඩ)
- ⋆ විදේශ වෙළෙඳාම රජුගේ මූලිකත්වයෙන් සංවිධානය වීම.
- ⋆ අභ්‍යන්තර වෙළෙඳාම දියුණු වූ බව - “කුරුණෑගල විස්තරය” නම් පුස්කොළ පොතේ එන තොරතුරුවලින් හෙළිවීම.
- ⋆ කාසි භාවිතය ප්‍රචලිත වූ බව

**මෙවැනි කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කිරීම**
**කරුණු තුනට ලකුණු 02**
**විස්තරයට ලකුණු 03**
**මුළු ලකුණු = 05**

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම කරන ලද අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව අඩු මට්ටමක පවතින අතර එය 49%කි. (ප්‍රස්තාරය 2 ඇසුරිනි.)

මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 18කි. ලකුණු 0-4 අතරට ගැනෙන නිවැරදි පිළිතුරු සැපයූ අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 63%කි. 5-9 අතර නිවැරදි පිළිතුරු සැපයූ අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 18%කි. ලකුණු 10-13 අතර ප්‍රමාණයක් ලබාගත් අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 11%ක් වූ අතර ලකුණු 14-18 නිවැරදි පිළිතුරු සපයා තිබුණේ 9%ක් වූ අවම අපේක්ෂකයින් සංඛ්‍යාවකි. (ප්‍රස්තාරය 3 ඇසුරෙනි)

මෙම ප්‍රශ්නයෙහි (i) කොටසේ A, B, C සඳහා නිවැරදි පිළිතුරු සැපයූ අපේක්ෂකයින් සම මට්ටමක පවතින බව පෙනී යයි. එනම් 38%-42% අතර වේ.

(ii) කොටසෙහි A, B, C, D කොටස්වලින් නිවැරදි පිළිතුරු සැපයූ අපේක්ෂක සංඛ්‍යාව අවම වන්නේ C කොටස සඳහා වන අතර එය 11%කි. A, B සඳහා නිවැරදි පිළිතුරු සැපයූ අපේක්ෂකයින් ගණන පිළිවෙලින් 25% සහ 22% වන අතර D කොටස සඳහා අයදුම්කරුවන් 40%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

(iii), (iv) කොටස් විස්තර කළ යුතු ප්‍රශ්න වන අතර, ඒ සඳහා සාර්ථක පිළිතුරු සැපයූ අපේක්ෂකයින් සංඛ්‍යාව අඩු බව පෙනී ගියේය. එය (iii) කොටසෙහි 30%ක් වන අතර (iv) කොටසෙහි 28%ක මට්ටමේ පැවතුණි. මේ ප්‍රශ්නයේදී (ii) කොටසෙහි නිවැරදි පිළිතුරු ලියූ අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව අඩු මට්ටමක පැවති අතර, රජවරු හා ඔවුන්ගේ රාජ්‍ය කාලයේ සිදුවීම් පිළිබඳ දැනුම මඳ වීම හේතුවක් වීමට පුළුවන.

මෙම ප්‍රශ්නයෙහි (iii) සහ (iv) කොටස්වලට සාර්ථක පිළිතුරු සැපයීමට අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙකු අසමත් වී ඇත. ඊට හේතු වශයෙන් දැක්විය හැක්කේ රාජධානිවල දේශපාලන හා ආර්ථික රටාව පිළිබඳ දැනුම අඩු වීම විය හැකිය.

- ★ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා ඒවා එක් එක් රාජධානි ලෙස නම් කර එක් එක් කණ්ඩායමට එම රාජධානියේ පුරවැසියන් ලෙස රඟ පෑමට අවස්ථා ලබා දෙමින් පාඩම් ඉගැන්වීම කළ යුතුය.
- ★ එක් එක් රාජධානිය ලෙස රඟ පෑමට සිසුන් දිරි ගන්වා ක්‍රමවත් රූපවාහිනී වැඩසටහන් ලෙස සකසා ඉදිරිපත් කිරීමට සිසුන් දිරි ගැන්විය යුතුය.

## 5 ප්‍රශ්නය

05. අපේක්ෂණය : **පෘතුගීසි හා ලන්දේසි බලය හමුවේ දේශීය පාලකයන් ක්‍රියාත්මක වූ ආකාරය තුලනාත්මකව විමසීමේ හැකියාව පිරික්සීම**

**5.** "ලංකාවේ පෘතුගීසි හා ලන්දේසි බලය ඇතැම් අවස්ථාවල දී සුළු ප්‍රදේශයකට සීමා කිරීමට සමත් වුව ද බාහිර උපකාර නොලබා ඔවුන්ගේ ආධිපත්‍යය මුළුමණින් ම නැතිකර දැමීමට දේශීය පාලකයෝ අපොහොසත් වූහ."

(i) *A* - ක්‍රි. ව. 1505 දී ලොරෙන්සෝ ද අල්මේද ඇතුළු පෘතුගීසි කණ්ඩායම පැමිණෙන විට කෝට්ටේ රජකළ රජතුමා

*B* - ක්‍රි. ව. 1602 දී ජෝරිස් වැන් ස්පිල්බර්ජන් නම් ලන්දේසි ජාතිකයා ලංකාවට පැමිණෙන විට කන්ද උඩරට රජකළ රජතුමා

*C* - ක්‍රි. ව. 1762 දී ජෝන් ෆයිබස් නම් ඉංග්‍රීසි ජාතිකයා දූත මෙහෙවරක් සඳහා ලංකාවට පැමිණෙන විට කන්ද උඩරට රජකළ රජතුමා

ඉහත *A, B* සහ *C* වලින් සඳහන් වන එක් එක් රජතුමාගේ නම කුමක්ද'යි පහත වරහන් තුළින් තෝරා පිළිවෙළින් ලියා දක්වන්න.

**(දෙන් පුවන් ධර්මපාල / නවවැනි ධර්ම පරාක්‍රමබාහු / පළමුවැනි විමලධර්මසූරිය / දෙවැනි රාජසිංහ / කීර්ති ශ්‍රී රාජසිංහ / ශ්‍රී වික්‍රම රාජසිංහ)** *(ලකුණු 03 යි)*

(ii) *A* - උඩරට රජධානියට ආක්‍රමණ එල්ල කළ පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරුන් **දෙදෙනකු** නම් කරන්න.

*B* - ලංකාවේ මුහුදුබඩ පළාත්වල පාලනය ගෙන ගිය ලන්දේසි ආණ්ඩුකාරවරුන් **දෙදෙනකු** නම් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසි බලය මුළුමණින් ම නැතිකර දැමීමට කෝට්ටේ හා සීතාවක පාලකයන්ට නොහැකි වූයේ ඇයිද'යි කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

(iv) ක්‍රි. ව. 1766 දී ලන්දේසීන් සමඟ කීර්ති ශ්‍රී රාජසිංහ රජු අත්සන් කළ ගිවිසුම උඩරට රාජ්‍යයට අවාසිදායක වූ ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) A - නව වන ධර්ම පරාක්‍රමබාහු
B - පළමුවන විමලධර්මසූරිය
C - කීර්ති ශ්‍රී රාජසිංහ (ලකුණු 1 × 3 = 03)

(ii) A - පේරෝ ලෝපේස් ද සූසා/ දොන් ජෙරනිමෝද අසවේදු/ කොන්ස්ටන්
ටැයින් ද සා/ දියෝගෝ ද මෙලෝ කැස්ත්‍රෝ

B - ඔන් එක්/ ඔන් හූන්ස්/ රයි ක්ලෝෆ්/ ඔන් එන්ගල් බෙක්/
විලියම් ෆල්ක්/ ලෝරන්ස් පිල්, ඔන් ඉමෝන් ...........

**(ලකුණු 1 × 4 = 04)**

(iii) ★ ප්‍රබල නාවුක හමුදාවක් නොමැතිවීම
★ පෘතුගීසින්ගේ යුද හමුදා ශක්තිය
★ දේශීය පාලකයන් අතර පැවති අසමගිය
★ පෘතුගීසීන් සතුව තිබූ යුද අවි බලය
★ ඇතැම් දේශීය ප්‍රභූන්ගෙන් (කෝට්ටේ) පෘතුගීසීන්ට ලැබුනු සහාය
★ කෝට්ටේ පාලකයන් වශයෙන් පෘතුගීසීන් බලය තහවුරු කර ගැනීම

**(ලකුණු 2 + 3 = 05)**

(iv) ★ වරාය පිළිබඳ අයිතිය ගිවිසුම අනුව ලන්දේසින්ට ලැබීම
★ මුහුදුබඩ ගව්වක් පමණ බිම් තීරුවක් ලන්දේසීන්ට පවරාදීමට සිදුවීම
★ කුරුඳු පිළිබඳ වෙළෙඳ ඒකාධිකාරය ලන්දේසීන්ට ලැබීම නිසා සිංහල රජුන්ට ලැබිය යුතු ආදායම නොලැබී යාම
★ ගිවිසුම අනුව උඩරට හා වෙරළබඩ ප්‍රදේශ අතර සිදුවූ වෙළෙඳාමෙන් උඩරට රජුන්ට අවාසි සිදුවීම (ලුණු වෙළෙඳාම)

**(ලකුණු 3 + 3 = 06)**

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව අඩු මට්ටමක පැවතුණි. එය 48% කි. (ප්‍රස්තාරය 2 අනුව)

ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 18කි. ලකුණු 0-4 ත් අතර ලකුණු ලබා ගත් අපේක්ෂක සංඛ්‍යාව 68%කි. ලකුණු 5-9 අයත් සංඛ්‍යාව 21%කි. 10-13 අතර නිවැරදි පිළිතුරු සපයා තිබුණේ 8%ක අපේක්ෂකයින්ගේ ප්‍රමාණයකි. 14-18 ලකුණු ලබාගත්තේ 4%කි. (ප්‍රස්තාරය 3)

මෙම ප්‍රශ්නය තොරාගත් අපේක්ෂකයින්ට ද සාර්ථකව පිළිතුරු සැපයීමට අපහසු වී ඇති බව පෙනී යයි. (i) A කොටසට නිවැරදි පිළිතුරු සැපයූ අපේක්ෂකයින් ගණන 12%කි. B කොටසට 27%කි. C කොටසට 40%කි. (ii) කොටසේ A, B සඳහා සාර්ථකව පිළිතුරු සැපයූ අපේක්ෂකයින් සංඛ්‍යාව 11%ට අඩුය. විස්තර කළ යුතු (iii) කොටස සඳහා 31%ක් පමණ පිරිසක් සාර්ථකව පිළිතුරු සපයා ඇති අතර, (iv) කොටසට 20%ක් පමණ පිරිසක් ද සාර්ථකව පිළිතුරු සපයා ඇත.

සෑම කොටසටම අඩු ලකුණු ලබා ගැනීමෙන් පෙනී යන්නේ අපේක්ෂකයින්ට පිළිතුරු ලිවීමට අවශ්‍ය දැනුම තහවුරු වී නොමැති බවයි. ප්‍රශ්නයේ අනෙක් කොටස්වලට සාපේක්ෂව (ii) කොටසට නිවැරදි පිළිතුරු සැපයීම අඩු මට්ටමක පැවති බව පෙනුණි.

★ කෝට්ටේ හා මහනුවර රාජධානි පිළිබඳ සම්පූර්ණ ඉතිහාසය තනි තනිව කියවීමට සිසුන් යොමු කළ යුතුය.

★ පෘතුගීසින් හා ලන්දේසින් ලංකාවට පැමිණීමේ අරමුණු හා එම කාලපරිච්ඡේදයේ කෝට්ටේ හා මහනුවර රාජධානිවල දේශපාලන හා ආර්ථික පසුබිම, කෝට්ටේ හා මහනුවර රාජධානි අල්ලා ගැනීමට පෘතුගීසින් හා ලන්දේසීන් අනුගමනය කළ ක්‍රියාකාරකම්, ඔවුන්ගේ ජයග්‍රහණ හා පරාදවලට හේතුන් යන මාතෘකා යටතේ කුඩා කතාන්දර ගොඩ නැගීමට සිසුන්ට දිරි ගැන්විය යුතුය.

★ පෘතුගීසීන් හා ලන්දේසින් පිළිබඳ තොරතුරු ඇතුළත් කෞතුකාගාර වෙත සිසුන් රැගෙන යා යුතුය.

## 6 ප්‍රශ්නය

06. අපේක්ෂණය : බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දක්වා වූ ආණ්ඩුක්‍රම විකාශය හා ඒවායේ මූලික ලක්ෂණ පිළිබඳ සංසන්දනාත්මක දැනුම හා අවබෝධය පිරික්සීම

**6.** (i) පහත දැක්වෙන කරුණු හා සම්බන්ධ පුද්ගලයන් *A, B, C* අනුපිළිවෙළින් නම් කරන්න.

*A* - ක්‍රි. ව. 1910 දී උගත් ලාංකියන්ගේ ඡන්දයෙන් ව්‍යවස්ථාදායක සභාවට තේරී පත්වූ තැනැත්තා

*B* - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රථම අගමැතිවරයා

*C* - ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා (ලකුණු 03 යි)

(ii) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා අනුව ලංකාවේ සිදුකරන ලද පරිපාලනමය වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ලබා දුන් ආණ්ඩුක්‍රමය අර්ධ වගකීම් සහිත පාලනයක් ලෙස සලකන්නේ ඇයිද'යි හේතු **දෙකක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ක්‍රි. ව. 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් නව නියෝජන ක්‍රම **තුන** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) A - ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන්
B - මහාමාත්‍ය ඩී.එස්.සේනානායක
C - ජේ.ආර්. ජයවර්ධන (ලකුණු 1 × 3 = 03)

(ii)
- ★ උඩරට පහතරට වශයෙන් වෙන් වෙන්ව තිබූ පරිපාලන ඒකක දෙක වෙනුවට එක් පාලන ක්‍රමයක් ඇති කිරීම.
- ★ ශ්‍රී ලංකාව පළාත් පහකට බෙදීම
- ★ සිවිල් සේවාව සංශෝධනය කිරීම
- ★ පරිපාලන සේවයට දේශීය ජනතාව යොදවා ගැනීම සඳහා ඉඩකඩ සැලසීම

(ලකුණු 2 × 2 = 04)

(iii)
- ★ පරිපාලනය, මුදල් කටයුතු හා අධිකරණය පිළිබඳ බලතල යුරෝපීය රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු වෙත පවරා තිබීම
- ★ කාරක සභා හතක් යටතේ අනෙකුත් කාර්යයන් දේශීය නියෝජිතයන්ට පැවරීම
- ★ ආණ්ඩුකාරයා බොහෝ විට යුරෝපීය රාජ්‍ය නිලධරයන් සමඟ පක්ෂග්‍රාහීව කටයුතු කිරීම
- ★ ආණ්ඩුකාරයා සතු වූ විශේෂ බලතල

(ලකුණු 2 + 3 = 05)

(iv)
- ★ ජනාධිපතිවරණය
- ★ සමානුපාතික නියෝජනය
- ★ ජනමත විචාරණය

මෙම නියෝජන ක්‍රම ක්‍රියාත්මක වන ආකාරය කෙටියෙන් දැක්වීම ප්‍රමාණවත්ව ය.

(ලකුණු 3 + 3 = 06)

පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

මෙම ප්‍රශ්නය අඩුම අපේක්ෂකයින් සංඛ්‍යාවක් තෝරාගත් ප්‍රශ්නය වූ අතර එය 23%කි. (2 ප්‍රස්තාරය ඇසුරිනි)

මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 18කි. 3 ප්‍රස්තාරයට අනුව ලකුණු 0-4 අතර ලබාගත් අපේක්ෂක සංඛ්‍යාව 67%කි. 5-9 අතර ලකුණු ලබාගත් සංඛ්‍යාව 23%කි. 10-13 අතර ලකුණු ලැබූ සංඛ්‍යාව 7% ක් ද, 14-18 සඳහා 3% ක් ද නිවැරදි පිළිතුරු ලකුණු කර තිබුණි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නයෙහි (i) කොටසේ A සඳහා 38%ක් ද, B සඳහා 58%ක් ද, C සඳහා 48%ක් ද, සාර්ථකව පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්නයේ (ii) කොටසට 24%ක් ද, (iii), (iv) කොටස් සඳහ 11%ක් ද නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

මෙහිදී වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ඇත්තේ කාලීන තොරතුරු හා සම්බන්ධ ප්‍රශ්නවලට වූ අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට ඇතුළත් වූ ප්‍රශ්න පිළිබඳව දැනුම ඌනතාවයකින් යුතු බව පෙනී ගියේය.

- ★ බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා එනම්, කෝල්බෲක්, ඩොනමෝර් ආදි ව්‍යවස්ථා පිළිබඳ රඟ දැක්වීමට ළමා පාර්ලිමේන්තුවක් පන්ති කාමරය තුළ ගොඩනැංවීමට සිසුන්ට මඟ පෙන්වීම.
- ★ සියලු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ආණ්ඩුක්‍රම විකාශය හා ඒවායේ මූලික ලක්ෂණ ඇතුළත් සංකල්ප සිතියමක් ගොඩ නැඟීම.
- ★ ජාතික නායකයින් පිළිබඳ පුවත්පත් දැන්වීම් පළ කිරීමට සිසුන් දිරි ගැන්වීම.
- ★ පාසලේ තිබෙන පහසුකම් අනුව විවිධ ජාතික නායකයින්ගේ තොරතුරු ඇතුළත් සංයුක්ත තැටි සකස් කිරීමට සිසුන් දිරි ගැන්වීම.

## 7 ප්‍රශ්නය

07. අපේක්ෂණය : දේශපාලන, ආර්ථික හා සමාජ යන අංශ ඔස්සේ වෛදික යුගය විශ්ලේෂණාත්මකව ඇගයීමේ හැකියාව පිරික්සීම

**III කොටස**

**7.** "වෛදික යුගය ඉන්දියානු ඉතිහාසයේ දේශපාලන, ආර්ථික හා සමාජ යන අංශවල නව ආරම්භයක් සේ සැලකිය හැකි ය."

(i) *A* - ඉන්දියාවට සංක්‍රමණය වූ ආර්යයන්ගේ මුල්බිම වශයෙන් සැලකෙන ප්‍රදේශය

*B* - ඉන්දියාවට බහුල වශයෙන් සංක්‍රමණ හා ආක්‍රමණ එල්ල වූ වයඹදිග පිහිටි දුර්ග මාර්ගය

*C* - ආර්ය ජනාවාස දකුණු ඉන්දියානු ප්‍රදේශ කරා ව්‍යාප්තවීමේ දී බාධාවක් ව පැවැති කඳුවැටිය,

ඉහත *A*, *B* සහ *C* වලට අදාළ පිළිතුරු පහත ලැයිස්තුවෙන් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

**(ස්ටෙප්ස්, ඛයිබර්, බෝලාන්, වින්ධ්‍යා, හින්දුකුෂ්, පාමීර්)** *(ලකුණු 03 යි)*

(ii) ඉන්දියාවට සංක්‍රමණය වූ ආර්ය ජානපදිකයන් පිළිබඳ ව තොරතුරු දැනගතහැකි වෛදික ග්‍රන්ථ **හතර** නම් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) ආර්යයන් ක්‍රි. පූ. හයවැනි සියවස පමණ වන විට ඉන්දියාව තුළ ව්‍යාප්ත වූ ආකාරය කෙටියෙන් පෙන්වා දෙන්න. *(ලකුණු 05 යි)*

(iv) වෛදික යුගයේ පැවැති ඉන්දියානු ජනජීවිතය පහත *A* හා *B* යන අංශ යටතේ පැහැදිලි කරන්න.

*A* - ආර්ථිකය

*B* - සමාජ සංවිධානය *(ලකුණු 06 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) A - ස්ටෙප්ස්
B - ඛයිබර්
C - වින්ධ්‍යා (ලකුණු 1 × 3 = 03)

(ii) ඍග්, යජුර්, සාම, අථර්වන් (ලකුණු 1 × 4 = 04)

(iii)
- ★ මුලින්ම සප්ත සින්දු ප්‍රදේශයේ ජනාවාස පිහිටුවා ගැනීම
- ★ ඉන් පසුව ගංගානම් ගංගාධාර ප්‍රදේශය කරා ක්‍රමයෙන් ව්‍යාප්ත වීම
- ★ වින්ධ්‍යා කඳු වැටියෙන් දකුණට ද ව්‍යාප්ත වූ බව
- ★ ක්‍රි.පූ. හයවන සියවස පමණ වන විට ජනපද දහසයක් යටතේ මෙම ව්‍යාප්තිය දැකිය හැකිය. (ලකුණු 05)

(iv) A - ආර්ථිකය
- ★ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මය වීම
  - ● ධාන්‍ය වගාව (තිරිඟු, බාර්ලි, වී)
  - ● සත්ත්ව පාලනය - (ගවයන් ඇති කිරීම ප්‍රධාන තැනක් ගැනීම)
- ★ ග්‍රාමීය මට්ටමින් විවිධ කර්මාන්ත සංවිධානය වීම. (ආභරණ, ගොවි උපකරණ, මැටි භාණ්ඩ........)
- ★ වෙළෙඳාම ද යම් ප්‍රමාණයකට වර්ධනය වී තිබීම. (භාණ්ඩ හුවමාරුව, සීමිත මුදල් භාවිතය)
- ★ භාණ්ඩ පරිවහනය සඳහා රට තුළ ගංගා හා ගොඩබිම් මාර්ග භාවිතය

B - සමාජ සංවිධානය
- ★ කුඩාම සමාජ ඒකකය පවුල වීම
- ★ පියා පවුලේ ප්‍රධානියා වීම
- ★ පවුල් කිහිපයක් එකතු වී ගෝත්‍ර සංවිධානය වීම හා පසුව එය රාජ්‍යයත්වය පදනම් කරගත් සමාජ සංවිධානයක් බවට පත් වීම.
- ★ පශ්චාත් වෛදික යුගයේ දී වර්ණ වශයෙන් (කුල වශයෙන්) සමාජය බෙදී යාම
- ★ සංස්කෘතිකාංග සමාජය තුළ වර්ධනය වීම (විවිධ දර්ශන වාද, සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්, සිරිත් විරිත්, උත්සව, ක්‍රීඩා ......)

(ලකුණු 3 + 3 = 06)

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

66%ක අපේක්ෂකයින් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය තෝරා ගෙන තිබුණි. (2 ප්‍රස්තාරය)

ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 18කි. 3 ප්‍රස්තාරයට අනුව ලකුණු 0-4 ලැබූ අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 36%ක් ද, 5-9 අතර ලකුණු ලැබූ සංඛ්‍යාව 33%ක් ද, 10-13 අතර 21%ක් ද, 14-18 අතර 11%ක් ද විය. (ප්‍රස්තාරය 3)

සමස්තයක් ලෙස ගත්විට මෙම ප්‍රශ්නයේ (i) කොටසේ A, B, C කොටස් අතුරින් B කොටසට එනම් 85%ක ප්‍රමාණයක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. A කොටසට 76%ක් ද, C කොටසට 48% ක් ද සාර්ථක පිළිතුරු සපයා ඇති බව පෙනුණි.

ප්‍රශ්න අංක 7 හි (ii) කොටසට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 40%ක ප්‍රමාණයක් වන අතර (iii) කොටසට 32%ක් ද, (iv) කොටසේ A සඳහා 53%ක් ද, B සඳහා 36%ක් ද සාර්ථක පිළිතුරු සපයා ඇති බව පෙනුණි.

- ඉන්දියන් සිතියමක් (පැරණි හා නවීන) ආධාරයෙන් මෙම කරුණු පිළිබඳ ඉගැන්වීම කළ යුතුය.
- මෙම **සිතියම් තුළින්** සිසුවා එම ඓතිහාසික ස්ථානවලට රැගෙන යා යුතුය.
- අතීත ඉන්දියානුවන්ගේ ජීවිත රටාව පන්ති කාමරය තුළ රඟ දැක්වීමට අවස්ථා සලසා දිය යුතුය.

## 8 ප්‍රශ්නය

08. අපේක්ෂණය : ඉන්දියාවේ බ්‍රිතාන්‍ය පාලනය හා ඉන්දියානු නිදහස් ව්‍යාපාරය පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය විමසීම

**8.** "බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ අනුගමනය කළ ප්‍රතිපත්ති ඉන්දියානුවන් තුළ බ්‍රිතාන්‍ය විරෝධී ආකල්ප ඉස්මතුවීම කෙරෙහි තදින් බලපෑ අතර ඉන්දියානු නිදහස් ව්‍යාපාරය සංවිධානාත්මක ව ගොඩනැඟීමට ද ඉවහල් විය."

(i) *A* - 1857 මැයි 10

*B* - 1947 අගෝස්තු 14

*C* - 1950 ජනවාරි 26

ඉහත සඳහන් දින තුන ඉන්දියා ඉතිහාසයේ වැදගත් වීමට හේතු වූ සිදුවීම් **තුන** පහත වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

**(වෙන ම රාජ්‍යයක් ලෙස පකිස්ථානය බිහිවීම / සිපෝයි කැරැල්ලේ ආරම්භය / ඉන්දියානු නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම / ඉන්දියාව බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් නිදහස ලැබීම / ඉන්දියානු ජාතික කොන්ග්‍රසය පිහිටුවීම)** *(ලකුණු 03 යි)*

(ii) *A* - ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ මධ්‍යස්ථ මතධාරී නායකයන් **දෙදෙනකු** ද

*B* - දැඩිමතධාරී නායකයන් **දෙදෙනකු** ද *A, B* අනුපිළිවෙළින් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට විරුද්ධව ඉන්දියාව තුළ සංවිධානාත්මක ජාතික ව්‍යාපාරයක් ආරම්භ වීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

(iv) ඉන්දියානු නිදහස් සටනේ ක්‍රියාකාරී නායකයකු ලෙස මහත්මා ගාන්ධිතුමාගේ දායකත්වය කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) A - සිපෝයි කැරැල්ලේ ආරම්භය

B - වෙනම රාජ්‍යයක් ලෙස පකිස්ථානය බිහිවීම

C - ඉන්දියානු නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම **(ලකුණු 1 × 3 = 03)**

(ii) A - මධ්‍යස්ථමතධාරීන් දෙදෙනෙක් : දඩාභායි නවුරෝජි/ ගෝපාල් ක්‍රිෂ්ණ ගෝඛලේ/ සුරේන්ද්‍රනාත් බැනර්ජි

**මෙයින් දෙදෙනෙකු නම් කිරීම ලකුණු 02**

B - සටන්කාමී නායකයන් දෙදෙනෙක් :
බාල් ගංගාධර් තිලක්/ බිපින් චන්ද්‍රපෝල්/ ලාලා ලජ්පත්රායි

**මින් දෙදෙනෙකු නම් කිරීම ලකුණු 02**

**(ලකුණු 2 + 2 = 04)**

(iii) බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට විරුද්ධව ඉන්දියාව තුළ සංවිධානාත්මක ජාතික ව්‍යාපාරයක් ආරම්භ වීමට බලපෑ හේතු :

- ★ බ්‍රිතාන්‍යයන් ඉන්දියානුවන් කෙරෙහි අනුගමනය කළ ප්‍රතිපත්ති මෙයට හේතු වූ බව
  - ● කෘෂි කාර්මික ප්‍රතිපත්තිය
    අධික ඉඩම් බදු හා ස්වයංපෝෂිත ග්‍රාමීය ආර්ථිකය බිඳ වැටීම නිසා ජනතාව පීඩනයට පත්වීම
  - ● කර්මාන්ත
    ඉන්දියාවේ සම්පත් තම රටට ගෙන යාම හා කර්මාන්ත සඳහා ව්‍යාපාරික පන්තිය උනන්දු කර වූ අතර ඉන්දියානුවන් අඩු වැටුපට කම්කරුවන් ලෙස යොදා ගැනීම - ශ්‍රමය සූරා කෑම, දේශීය කර්මාන්තවලට අනුග්‍රහ නොදැක්වීම නිසා ඒවා පිරිහීයාම
  - ● සාගත
    ඉන්දියාවේ වරින් වර හටගත් සාගතවලින් ඉන්දියානුවන් ලක්ෂ ගණනින් මිය යාම හා ඔවුන් ඉන් මුදා ගැනීමට බ්‍රිතාන්‍යයන් ප්‍රමාණවත් සැලකිල්ලක් නොදැක්වීම.
  - ● බටහිර අධ්‍යාපන ක්‍රමය
    බ්‍රිතාන්‍යයන් සිය පරිපාලන, දේශපාලන හා සංස්කෘතික අවශ්‍යතා ඉටුකළ ද ඉන් ඇති වුයේ ඊට විරුද්ධ ප්‍රතිඵලයකි.
- ★ ඉංග්‍රීසි අධ්‍යාපනය නිසා යුරෝපා රටවල පැවති ජාතිකානුරාගී ව්‍යාපාර පිළිබඳව අවබෝධයක් ඉන්දියානුවන්ට ලැබීම.
- ★ විවිධ භාෂා කථා කරන ඉන්දියානුවන් අතර සමීප සබඳතා ඇති තිරීමට හේතු වූ අතර එමගින් ඉන්දියානුවන්ට අදහස් හුවමාරු කර ගැනීමේ හැකියාව ලැබීම.
- ★ බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ යටිතල පහසුකම් දියුණු කිරීම නිසා හටගත් ඒකාබද්ධතාව ඉන්දියානුවන් එකම ජාතියක් සේ සිතීමට රුකුල් දීම.
- ★ බ්‍රිතාන්‍යන්ගේ උද්දච්ච බව, ඉන්දියානුවන් කොන් කිරීම, නීතිය ඉදිරියේ ඉන්දියානුවන් සමාන නොවීම.
- ★ බ්‍රිතාන්‍යයන් ඉන්දියාව තුළ අනුගමනය කළ මර්දනකාරී නීති, රීති
- ★ ඉන්දියාවේ පැවති පැරණි ශ්‍රී විභූතිය පිළිබඳ තොරතුරු හෙළිවීම නිසා ඉන්දියානුවන් තුළ අභිමානයක් ඇති වීම.

**මෙවැනි හේතු දෙකක් විස්තර කර තිබිය යුතුය.**

**හේතු දෙක නම් කිරීමට ලකුණු 02**

**විස්තර කිරීමට ලකුණු 03**

**මුළු ලකුණු = 05**

(iv) ඉන්දියානු නිදහස් සටනට මහත්මා ගාන්ධිතුමාගේ දායකත්වය

- ★ සත්‍යග්‍රහ ව්‍යාපාර
  - ● බ්‍රිතාන්‍යය යටත් විජිතවල කම්කරුවන් ලෙස සේවය කිරීම ඉන්දියානුවන් ගෙන් ලබාගෙන තිබූ පොරොන්දු පත්‍ර අවලංගු කිරීම සඳහා සත්‍යග්‍රහයක් පැවැත්වීම - ඉන්ඩිගෝ වගා කරන්නන් වෙනුවෙන්
- ★ සහයෝගිතා වර්ජනය ව්‍යාපාරය
  - ● උසාවි, ව්‍යවස්ථාදායක මණ්ඩල, අධ්‍යාපන ආයතන හා බ්‍රිතාන්‍යයේ

නිෂ්පාදිත භාණ්ඩ වර්ජනය කිරීම

- බ්‍රිතාන්‍යයන් විසින් පිරිනමන නම්බුනාම තාන්න මාන්න වර්ජනය
- දේශීය භාණ්ඩ නිෂ්පාදනය හා උනන්දු කරවීම
- හින්දු මුස්ලිම් මිත්‍රත්වය වර්ධනය සඳහා කටයුතු කිරීම

★ සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරය
  - දණ්ඩී පාගමන (ලුනු බද්ද පිළිබඳ නීතිය කඩ කිරීම සඳහා සබරමතී ආශ්‍රමයේ සිට දණ්ඩී වෙරළ දක්වා)

★ "ඉන්දියාවෙන් ඉවත් වෙනු" ව්‍යාපාරය

★ ඉන්දියානු ජාතික කොන්ග්‍රසය හා මුස්ලිම් සංගමය සමඟ එකඟතාවක් ඇති කිරීමට "සිම්ලා" සම්මේලනය සංවිධානය කිරීම.

මෙවැනි කරුණු තුනක් විස්තර කිරීම

කරුණු 03 ට ලකුණු 02

විස්තර කිරීමට ලකුණු 03

මුළු ලකුණු = 05

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයික්ගේ සංඛ්‍යාව 30%කි. (2 ප්‍රස්තාරයට අනුව)

මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 18කි. 0-4 අතර ලකුණු ලබාගෙන ඇත්තේ 55%ක අපේක්ෂකයින් ප්‍රමාණයක් වන අතර 5-9 අතර 20%ක් ද, 10-13 අතර 14%ක් ද, 14-18 අතර 12%ක් ද විය. (ප්‍රස්තාරය 3)

(i) කොටසේ A සඳහා නිවැරදි පිළිතුරු සැපයූ අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 68%කි. පිළිවෙළින් B සඳහා 31%ක් ද, C සඳහා 44%ක් ද නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. මෙහි (ii) කොටසේ A සඳහා 44%ක් ද, B සඳහා 31%ක් ද, නිවැරදි පිළිතුරු සපායා ඇත. (iii) කොටස සඳහා සාර්ථකව සැපයීමට සමත් වී ඇත්තේ 29% ක පමණ අඩු අපේක්ෂකයින් සංඛ්‍යාවකි. (iv) කොටස සඳහා 37%ක් අපේක්ෂකයින් ප්‍රමාණයක් සාර්ථකව පිළිතුරු සපයා ඇත.

සමස්තයක් ලෙස ගත් විට (ii) කොටස සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් හිමි වීමට හේතු වී ඇත්තේ ඉන්දියාව පිළිබඳ තොරතුරු හැදෑරීමේ දී ඒ සම්බන්ධව වැඩි අවධානයක් යොමු නොකිරීම විය හැක. (iv) කොටසේ දී ද විස්තරාත්මක පිළිතුරු සැපයීමේ දුර්වලතාවය දක්නට ලැබුණි.

★ මෙම කරුණු මැත ඉතිහාසය හා සම්බන්ධ බැවින් මේ හා සම්බන්ධ තොරතුරු සෙවීමට සිසුන් යොමු කළ යුතුය.

★ විවිධ සාකච්ඡා හා වැඩමුළු තුළින් මේ පිළිබඳ වැඩි දැනුමක් සිසුන්ට ලබා දීමට ගුරුවරුන් සැලසුම් කළ යුතුය.

★ ඉහත ක්‍රියාකාරකම් සඳහා බාහිර සුදුසු සම්පත් පුද්ගලයන් යොදා ගැනීමට ගුරුවරුන් ක්‍රියා කළ යුතුය.

## 9 ප්‍රශ්නය

09. අපේක්ෂණය : එංගලන්තයෙන් ආරම්භ වූ කාර්මික විප්ලවය ලොව බොහෝ රටවල දේශපාලන ආර්ථික හා සාමාජික ක්ෂේත්‍ර කෙරෙහි ඇති කරන ලද බලපෑම විමර්ශනාත්මකව විග්‍රහ කිරීමේ හැකියාව මැනීම

**9.** "එංගලන්තයේ ආරම්භ වූ කාර්මික විප්ලවය කෙටි කාලයක දී ලොව බොහෝ රටවලට ව්‍යාප්ත වූ අතර එය දේශපාලන, ආර්ථික හා සාමාජික ක්ෂේත්‍ර කෙරෙහි ඉමහත් බලපෑමක් ද ඇති කෙළේ ය."

(i) එංගලන්තයේ ආරම්භ වූ කාර්මික විප්ලවය කෙටි කලක දී යුරෝපයේ සෙසු රටවලට ද ව්‍යාප්ත විය. එසේ ව්‍යාප්ත වූ යුරෝපා රටවල් **තුනක්** නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) කාර්මික විප්ලව සමයේ නිපදවන ලද නව නිපැයුම් කිහිපයක් *A, B, C* හා *D* යටතේ දැක්වේ. ඒවා නිපදවන ලද පුද්ගලයන්ගේ නම් වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

*A* - අහස් යානය

*B* - රෙදි මැසීමේ යන්ත්‍රය

*C* - වාෂ්ප දුම්රිය එන්ජිම

*D* - මෝටර් රථය

**(ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්, රයිට් සහෝදරයෝ, ජෝර්ජ් ස්ටීවන්සන්, ජේම්ස් වොට්, එලියස් හෝවේ, ඩෙම්ලර්, ජෝන් මැකඩම්, සැමුවෙල් මෝර්ස්)** *(ලකුණු 04 යි)*

(iii) දහනවවැනි සියවසේ දී යුරෝපා රටවල කාර්මීකරණය පැතිරීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

(iv) කාර්මික විප්ලවය නිසා ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල සිදු වූ වෙනස්කම් **තුනක්** විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) ප්‍රංශය, ජර්මනිය, බෙල්ජියම, ඔස්ට්‍රියාව, ප්‍රශියාව

මේ රටවලින් තුනක් නම් කිරීම (ලකුණු 1 × 3 = 03)

(ii) A - රයිට් සහෝදරයෝ
B - එලියස් හෝවේ
C - ජෝර්ජ් ස්ටීවන්සන්
D - ඩෙම්ලර් (ලකුණු 1 × 4 = 04)

(iii) 19 වැනි සියවසේ යුරෝපා රටවල කාර්මීකරණය පැතිරීමට බලපෑ හේතු :

- ⋆ යුරෝපා මහාද්වීපය තුළ ජනගහනය සීඝ්‍රයෙන් වැඩිවීම
- ⋆ යුරෝපා මහාද්වීපය තුළ ගමනාගමනය හා ප්‍රවාහන කටයුතුවල වර්ධනය
- ⋆ වාණිජ කටයුතු ව්‍යාප්තියට සුදුසු පරිදි නීති හා පරිපාලන ප්‍රතිසංස්කරණ සිදු කිරීම
- ⋆ කර්මාන්තවලට හා මාර්ග ඉදි කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම
- ⋆ යුද සමයේ එංගලන්තය පැන වූ වෙළෙඳ බාධක නිසා කපු රෙදි ආනයනය අඩපණ විම යුරෝපයේ ලෝම රෙදි සඳහා ඉල්ලුම වැඩිවීමට හේතු වීම
- ⋆ තීරු බදු ඉවත් කිරීම නිසා පහසුවෙන් අමුද්‍රව්‍ය ලබා ගත හැකි වීම
- ⋆ ප්‍රංශයේ හා ජර්මනියේ ගල් අඟුරු සොයා ගැනීම
- ⋆ යුරෝපා රටවල් බොහොමයක් සතුව යටත් විජිත පැවතීම නිසා අමුද්‍රව්‍ය ලබා ගැනීමත් නිමි භාණ්ඩ වෙළඳාමත් පහසුවීම

මෙවැනි හේතු දෙකක් විස්තර කර තිබිය යුතුය.

හේතු දෙක නම් කිරීමට ලකුණු 02

විස්තර කිරීමට ලකුණු 03

මුළු ලකුණු = 05

(iv) කාර්මික විප්ලවය නිසා ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල සිදු වූ වෙනස්කම්

ආර්ථික ක්ෂේත්‍රය

- කාර්මික නිෂ්පාදන පුළුල් කිරීම
- වාණිජ කටයුතු ආර්ථික ක්ෂේත්‍රයේ පෙරමුණ ගැනීම

- ආනයන අපනයන ආර්ථිකයන් වර්ධනය වීම
- කෘෂි නිෂ්පාදන කටයුතු කාර්මිකරණය වී ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන බහුලව වෙළෙඳපොලට ඒම
- සුළු ඉඩම් හිමි ගොවීන්ට සිය ආර්ථික කටයුතු කරගත නොහැකි වීම නිසා කම්හල්වල ශ්‍රමිකයන් ලෙස නගරයට ඇදී ඒම
- පුළුල් වූ වෙළෙඳ කටයුතු සඳහා මුදල් ආයෝජනය කිරීමට ව්‍යාපාරික සංවිධාන බිහි වීම
- බහු ජාතික සමාගම් බිහි වීම
- මුදල් හා බැංකු කටයුතුවල දියුණුව

සමාජයීය ක්ෂේත්‍රය

- කාර්මිකරණය සමඟ නගර සංඛ්‍යාව වැඩි වීම හා විශාල නගර බිහිවීම
- කර්මාන්තශාලා බිහිවීම නිසා ඒවායේ සේවයට පැමිණි ස්ත්‍රී පුරුෂ හා ළමා ශ්‍රමිකයින් කම්හල් අසල පදිංචි වීම
- මේ නිසා කම්හල් අවට ප්‍රදේශ ජනාකීර්ණ නගර බවට පත්වීම
- නගර ඔරොත්තු නොදෙන තරමට ජනාකීර්ණ වූ අතර ඒවාට මූලික පහසුකම් සැපයීම අඩුවේගයකින් සිදුවීම. (නිද. ජන සංඛ්‍යාව 20% කින් වැඩි වුවද නිවාස ඉදිකිරීම වර්ධනය වූයේ 11.5% කිනි.)
- පන්ති සමාජයක් බිහිවීම - (ධන හිමියන් හා නිර්ධන පන්තික ශ්‍රමිකයන් ලෙස ද ධන හිමියන් රදළ ප්‍රභූන් හා මධ්‍යම පන්තිය ලෙස ද වෙන් වීම)
- නිර්ධන පන්තිකයන් වූ ශ්‍රමිකයන් අඩු ආදායම්ලාභීන් වීම, එම පවුල්වල ගැහැණු පිරිමි දෙපක්ෂයත් දරුවනුත් රැකියාවල නිරත වීම
- දෙමව්පියන් රැකියාවලට යාම නිසා දරුවන් විවිධ අපචාරවලට ගොදුරු වීම
- කම්කරුවන්ගේ ජීවිතවල සුරක්ෂිතබවක් නොවීම
- සමාජ විරෝධී ක්‍රියා බහුල වීම
- ජන ජීවිතයේ කටයුතු පහසුවීම
- පරිසර දූෂණය ඇතිවීම **(ලකුණු 3 + 3 = 06)**

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 75%කි. (2 ප්‍රස්තාරයට අනුව)

ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 18කි. 0-4 අතර ලකුණු ලබාගෙන ඇති අපේකෂකයින් ප්‍රමාණය වන්නේ 41%කි. 5-9 අතර 38%ක් ද, 10-13 ලකුණු ප්‍රමාණයක් ලබා ගෙන ඇති අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 14%ක් වූ අතර ලකුණු 14-18 ප්‍රමාණයක් හිමි කර ගැනීමට සමත් වූයේ අපේක්ෂකයන්ගෙන් 7%ක් වැනි සුළු ප්‍රමාණයකි. (ප්‍රස්තාරය 3)

ප්‍රශ්න අංක 9 හි (i) කොටස සඳහා 32%ක ප්‍රමාණයක් නිවැරදි පිළිතුරු සපයා තිබූ අතර (ii) කොටසේ A සඳහා 90% නිවැරදි පිළිතුරු සපයා තිබූ අතර B කොටස එම ප්‍රමාණය ද ඉක්මවා යමින් 94%ක අපේක්ෂකයින් පිරිසක් නිවැරදිව පිළිතුරු සැපයීමට සමත් වී ඇත. C කොටස සඳහා 43%ක් ද D සඳහා 31%ක් ද, සාර්ථක පිළිතුරු සපයා තිබුණි. මෙම ප්‍රශ්නයෙහි (iii) කොටස සඳහා 26%ක් ද, (iv) කොටස සඳහා 30%ක වැනි අඩු ප්‍රමාණයක් ද සාර්ථකව පිළිතුරු සපයා ඇත.

- ★ අන්තර්ජාලය තුළින් තොරතුරු ලබා ගැනීමට සිසුන් යොමු කළ යුතුය. විශේෂයෙන් නවතම සොයා ගැනීම් පිළිබඳ තොරතුරු සෙවීමට සිසුන් යොමු කළ යුතුය.
- ★ ඉහත තොරතුරු හා සම්බන්ධ වගුවක් ගොඩ නැඟීමට සිසුන් උනන්දු කළ යුතුය.
- ★ කාර්මික විප්ලවය පිළිබඳ කණ්ඩායම් සාකච්ඡා හා කථික තරග පැවැත්වීම.

## 10 ප්‍රශ්නය

10. අපේක්ෂණය : ලෝක මහා සංග්‍රාමවලින් පසුව නිර්මාණය වූ ලෝකය දෙස විශ්ලේෂණාත්මක විග්‍රහ කිරීමේ හැකියාව පිරික්සීම

**10.** "ලෝක සංග්‍රාමවලින් පසුව බිහි වූ සාමය සඳහා වූ ජාත්‍යන්තර සංවිධාන රටවල් අතර ඇති වූ ගැටුම් බොහොමයක් සමථයකට පත් කිරීමට සමත් වුව ද ප්‍රධාන බල කඳවුරු අතර පැවැති බල අරගලය නිසා ඇතැම් සාම ප්‍රයත්න අසාර්ථක විය."

(i) *A* - පළමුවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ලෝක සාමය උදෙසා පිහිටුවාගත් සංවිධානය ද
*B* - දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ලෝක සාමය උදෙසා පිහිටුවාගත් සංවිධානය ද
*C* - ප්‍රබල ඊශ්‍රායෙල් රහස් ඔත්තුසේවාව ද,
අනුපිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) *A* - දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ධනවාදී පිලට නායකත්වය දුන් රටවල් **දෙකක්** ද
*B* - සමාජවාදී පිලට නායකත්වය දුන් රටවල් **දෙකක්** ද නම් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ගත වූ දශක දෙක තුළ එකිනෙකට විරුද්ධව බල කඳවුරු දෙක සෘජුව ම අවිගැටුමකට යොමු නොවුව ද ඔවුනතර බල අරගලයක් පැවැති බව සනාථ කරන සිද්ධීන් **දෙකක්** විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

(iv) දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව, දේශපාලනමය වශයෙන් ලෝකයේ ඇති වූ වෙනස්කම් **තුනක්** පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) A - ජාතීන්ගේ සංගමය/ ජාතීන්ගේ සංවිධානය
B - එක්සත් ජාතීන්ගේ සංවිධානය / UNO
C - මොසාඩ්

**(ලකුණු 1 × 3 = 03)**

(ii) A - ඇමරිකාව/ ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ජර්මනිය (බටහිර)
B - සෝවියට් දේශය/ රුසියාව, චීනය

**(ලකුණු 2 + 2 = 04)**

(iii)
- ★ බර්ලින් ප්‍රශ්නය
- ★ කොරියන් අර්බුදය
- ★ සූවස් අර්බුදය
- ★ කියුබානු මිසයිල අර්බුදය

**මෙම සිද්ධීන් සරලව විස්තර කිරීම ප්‍රමාණවත් ය.**

**(ලකුණු 2 + 3 = 05)**

(iv)
- ★ එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීම
- ★ නැගෙනහිර යුරෝපා රටවල කොමියුනිස්ට් පාලනයක් ඇතිවීම
- ★ ධනවාදී හා සමාජවාදී යනුවෙන් බල කඳවුරු දෙකක් බිහිවීම
- ★ යටත් විජිතව පැවති රටවල් නිදහස් වීම
- ★ නේටෝ, වෝර්සෝ වැනි ආරක්ෂක සංවිධාන බිහිවීම
- ★ ඊශ්‍රායලය වැනි නව රටවල් බිහිවීම/ යුගෝස්ලෝවියාව
- ★ සීතල යුද්ධය හෙවත් නිරවි යුද්ධය ක්‍රියාත්මක වීම
- ★ බල කඳවුරුවලට ගැති නොවූ රටවල් නොබැඳි ජාතීන් ලෙස සංවිධානය වීම
- ★ චීනයේ කොමියුනිස්ට් පාලන බිහිවීම
- ★ ජර්මනිය දෙකඩ වීම

**(ලකුණු 3 + 3 = 06)**

අඩුම අපේක්ෂකයින් පිරිසක් තෝරා තිබූ ප්‍රශ්නය මෙයයි. එනම් 23%ක වැනි ප්‍රමාණයකි. (2 ප්‍රස්තාරය ඇසුරෙනි.)

මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 18කි. 0-4 අතර 49%ක් අපේක්ෂකයින් පිළිතුරු සපයා තිබුණි. 5-9 අතර 28%ක් ද, 10-13 අතර 14%ක් ද, 14-18 යටතේ 9%ක් අපේක්ෂකයින් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

ප්‍රශ්න අංක 10 හි (i) කොටසේ A, B සඳහා නිවැරදි පිළිතුරු සැපයූ අයදුම්කරුවන් ගණන ඉහළ මට්ටමක පැවතුණි. එනම් පිළිවෙළින් 59%ක් හා 64% ක් විය. C කොටසට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ 19%ක් වැනි සුළු ප්‍රතිශතයකි.

(ii) කොටසෙහි A සඳහා 65%ක් ද, B සඳහා 38%ක් ද, සාර්ථකව පිළිතුරු ඉදිරිපත් කර තිබුණි. (iii) කොටස සඳහා 19%ක් ද, (iv) කොටස සඳහා 33%ක් ද, සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. මෙම ප්‍රශ්නයේ අඩුම නිවැරදි ප්‍රතිචාර දක්වා ඇත්තේ (iii) කොටසට බව පෙනුනි.

- ⋆ මෙම ප්‍රශ්නය නවීන ලෝක ඉතිහාසය සම්බන්ධ ප්‍රශ්නයක් වන අතර, එබැවින් මේ හා සම්බන්ධ බොහෝ ඉගෙනුම් සම්පත් ඇත. එනම්, ඉංග්‍රීසි චිත්‍රපට, විවරණ ආදිය ඇත. මේ දේවල් සොයා බැලීමට සිසුන් උනන්දු කරවිය යුතුය.

- ⋆ බොහෝ තොරතුරු පුස්තකාලය පරිහරණයෙන් ලබා ගත හැකි අතර, ඒ පිළිබඳ සෙවීමට සිසුන් උනන්දු කර විය යුතුය. එමෙන්ම විවිධ සඟරා, පුවත්පත් ආශ්‍රයෙන් ද විවිධ තොරතුරු රැස් කර ඒවා කියවීමට සිසුන් උනන්දු කරලීම තුළින් සිසුන්ට මනා ඇනුමක් හා අවබෝධයක් ලබා ගත හැක.

## III කොටස

# 3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

## 3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස් :**

★ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද? කුමන ප්‍රශ්න අනිවාර්යය ද? කොපමණ කාලයක් ලැබේ ද? කොපමණ ලකුණු ලැබේ ද? යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.

★ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි එක් පිළිතුරක් තෝරා ගත යුතුය. තවද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය.

★ II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

★ ප්‍රශ්න අංක හා අනු කොටස් නිවැරදිව ලිවිය යුතුය.

★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.

★ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.

**විශේෂ උපදෙස් :**

★ සිතියම් ලකුණු කිරීමේ දී නිවැරදිව පැහැදිලිව නියමිත ස්ථානයට ඉතා ආසන්නයෙන් නම ලිවිය යුතුය.

★ සිතියමක නගරයක් ලකුණු කිරීමේ දී තිත් ලකුණකින් ද යම් ප්‍රදේශයක් මුහුදක් ආදිය ලකුණු කිරීමේ දී එම ප්‍රදේශයම අඳුරු කර නම ලියා දැක්විය යුතුය. ගංගාවක් ලකුණු කිරීමේ දී ගඟ දිගේ නම ලිවිය යුතුය.

★ විස්තරාත්මක පිළිතුරු ලිවීමේ දී ඓතිහාසික උදාහරණ සැපයිය යුතුය.

★ යම් සිදුවීමක දී වර්ෂය ලිවිය යුතු අතර, නැති නම් එය ශත වර්ෂය ලෙස දැක්විය යුතුය. නමුත් යම් ඓතිහාසික සිදුවීමත් සමඟ එය සිදු වූ කාලය සඳහන් කළ යුතුය.

★ විශේෂයෙන් ශ්‍රී ලංකා ඉතිහාසය ගැන ලිවීමේ දී ඒ හා සම්බන්ධ අනෙකුත් නම් ද සඳහන් කරන්නේ නම් ඉතා සුදුසු ය.
උදා : පොළොන්නරුව - විජිතපුර, පුලතිසිපුර
වළගම්බා - වට්ටගාමිණි

★ II ප්‍රශ්න පත්‍රයේ සමහර ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ දී ආගමික, දේශපාලනික, සාමාජීය, ආර්ථික වශයෙන් කොටස්වලට වෙන් කළ පිළිතුරු සැපයිය යුතුය. අදාළ කරුණු මඟ නොහැර පිළිතුරු සැපයිය යුතුය.

3.2. **ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :**

★ ඉතිහාසය පිළිබඳ තොරතුරු පොත්පත්, සඟරා, පුවත්පත් හෝ අන්තර්ජාලය භාවිතයෙන් ඉතිහාසය උගන්වන ගුරුවරයා විසින් සොයා කියවා ඉතිහාසය පිළිබඳ තම දැනුම තහවුරු කරගත යුතුය.

★ ලංකා ඉතිහාසය පිළිබඳ ඉගැන්වීමේ දී එක් එක් කාලවකවානුව හා සම්බන්ධ සිතියම් ගුරුවරයා විසින්ම සකසා ගත යුතුය.

★ ඉතිහාසය පිළිබඳ ඉගැන්වීමට පෙර සිසුන්ට අපහසු කොටස් සම්බන්ධව පැවරුම්පත් සකස් කර ඒ ආශ්‍රයෙන් ඉගැන්වීමේ කටයුතු කළ යුතුය.

★ සෑම පාඩමකටම අදාළව ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් කුඩා කුඩා පොත් සැකසීමට ආකෘති, විවරණ, චිත්‍ර ආදිය පන්ති කාමරය තුළදීම කිරීමට සිසුන්ට මඟ පෙන්විය යුතුය.

★ සිතියම් ලකුණු කිරීම පිළිබඳ විශේෂ අවධානයක් හා ඊට උචිත ක්‍රම අනුගමනය කිරීමට ගුරුවරුන් උනන්දු විය යුතුය.

- ගංගා හඳුනා ගැනීම
- වරායවල් හා මුහුදු හඳුනා ගැනීම
- වැදගත් නගර
- ආර්යයන් පැමිණ ජනාවාස පිහිටුවාගත් ස්ථාන හඳුනා ගැනීම
- ඉපැරණි වැව් හා ඇළ මාර්ග හඳුනාගෙන වෙනස් වර්ණවලින් වර්ණ ගැන්වීම
- ගංගා හෝ පැරණි නගර හෝ වෙනත් මතක තබා ගත යුතු දේ ඉලක්කම්, අක්ෂර හෝ මතකයේ තබා ගත හැකි දේ මගින් සිසුන්ට කියා දීම
- සිසුන් ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති, චිත්‍ර හෝ ආයුධ පිළිබඳ පින්තූර එකතු කොට රැස් කර ගැනීමට උනන්දු කර වීම.
- එම පින්තූර යුග අනුව වර්ග කර එම පින්තූර පිළිබඳ කෙටි සටහන් ලිවීම